# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අංක 1,582 - 2008 දෙසැම්බර් මස 26 වැනි සිකුරාදා - 2008.12.26**

(ආණ්ඩුවේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස : (IIඅ) වැනි ඡේදය - පළකිරීම්

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත.)


| | පිටුව | | පිටුව |
|---|---|---|---|
| තනතුරු - ඇබෑර්තු ... ... ... ... | 1046 | විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... | 1050 |


**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයෙහි* සෑම කොටසකටම අග පිටුවෙහි සෑම මාසයකම මුල් සතියේ දී පළ කරනු ලබන *ගැසට්* නිවේදන බාර ගන්නා අවසාන දිනය සහ වේලාව සඳහන් නිවේදන කෙරෙහි ඔබගේ අවධානය මීන් යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* සෑම කොටසකම පළකළ යුතු *ගැසට්* නිවේදන භාර ගන්නා වේලාව, *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන සිකුරාදා දිනට සති දෙකකට පෙර එළඹෙන සිකුරාදා දිනයෙහි දහවල් 12 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, ටෙන්ඩර් දැන්වීම්, වෙන්දේසි පිළිබඳ දැන්වීම් යනාදියෙහි සඳහන් කරනු ලබන අවසාන දිනය සහ වේලාවන් ඊට අනුරූපව - එනම් දැන්වීම්, රජයේ මුද්‍රණාලයට එවන සහ එම දැන්වීම්, පළ කරන දින අතර සෑහෙන කාල වේලාවක් දෙමින් එම දැන්වීම්වල සඳහන් කරුණු කෙරෙහි උනන්දුවක් දක්වන සෑම කෙනෙකුටම ප්‍රයෝජනවත් වන පරිදි ඊට සහභාගිවීමට ඉඩ ප්‍රස්ථාවක් සැළසෙන සේ සකස් කරන මෙන් සියලු ම දෙපාර්තමේන්තු, සංස්ථා, මණ්ඩල යනාදියෙන් මීන් ඉල්ලා සිටිනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම පිණිස එවන සෑම දැන්වීමක්ම *ගැසට් පත්‍රය* ප්‍රසිද්ධ කරනු ලබන දිනට සති දෙකකට පෙර - එනම් 2009 ජනවාරි මස 02 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයට* යා යුතු දැන්වීම් 2008 දෙසැම්බර් මස 19 වැනි දින දහවල් 12.00 ට හෝ ඊට පෙර රජයේ මුද්‍රණාලයට ලැබෙන සේ එවිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2008 ජනවාරි මස 01 වැනි දින,
ආණ්ඩුවේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.


1729 - B 079970 —9,100 (2008/12)
B1-

## ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන රාජ්‍ය සේවා පත් කිරීම්වලට අදාළ වන පොදු කොන්දේසි

**අවශ්‍ය සාමාන්‍ය සුදුසුකම් :**

1.1 තමා ශ්‍රී ලාංකිකයෙකු බවට ප්‍රමාණවත් සාක්ෂි සෑම අයදුම්කරුවකු විසින්ම ඉදිරිපත් කළ යුතුය.

ශ්‍රී ලාංකික යනුවෙන් අදහස් කෙරෙනුයේ ලංකා පුරවැසි පනතේ අර්ථ දක්වා ඇති පරිදි පාරම්පරික වශයෙන් හෝ ලියාපදිංචි කරවා ගැනීමෙන් හෝ ශ්‍රී ලංකාවේ පුරවැසිකම් ලැබූවෙකි.

1.2 ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන හෝ ඊට වඩා උසස් විභාගයකින් සමත් වී තිබීම අවම අධ්‍යාපනික සුදුසුකමක් වශයෙන් නියම කොට ඇති යම් තනතුරක් සඳහා ඉල්ලුම් කරන අයදුම්කරුවෙකු සිංහල හෝ දෙමළ හෝ මාධ්‍යයෙන් අධ්‍යාපනය ලැබූ අයෙකු වේ නම්, ඔහු ජ්‍යෙෂ්ඨ පාඨශාලා සහතික පත්‍ර විභාගයෙන් හෝ ඊට සමාන විභාගයකින් හෝ සිංහල හෝ දෙමළ හෝ භාෂාව විෂයයෙන් අවස්ථාවෝචිත පරිදි සමත් වී සිටිය යුතුය. (1961 ජනවාරි මස 1 වැනි දිනට පෙර දිනක සිට රාජ්‍ය සේවයෙහි යෙදී සිටින්නාවූත් රාජ්‍ය සේවයෙහි වෙනත් තනතුරුවලට ඉල්ලුම් කරන්නාවූත් නිලධාරීන් විෂයෙහි මෙම නියමය අදාළ නොවන්නේය.)

*1.3 අයදුම් කරනු ලබන තනතුර සඳහා නියමිත ඉහළම රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණවලින් නිදහස් කිරීමට හිමිකම් ලබන සුදුසුකම් පසු කලකදී ලබා තිබේ නම් මිස, නියමිත රාජ්‍ය භාෂා ප්‍රවීණතා පරීක්ෂණය සමත්වීමට අපොහොසත්වීම නිසා පරිවාස/පරීක්ෂණ කාලයකට යටත් දෙන ලද සිය පත්වීම අවසන් කරනු ලැබූ, සිංහල හෝ දෙමළ හෝ නොවන භාෂා මාධ්‍යයකින් රජයේ සේවයට ඇතුළත්ව සිටි නව ප්‍රවේශක නිලධාරීන්ගෙන් ලැබෙන අයදුම්පත් භාරගනු නොලැබේ.

**2. සේවා කොන්දේසි - සාමාන්‍ය :**

2.1 රාජ්‍ය සේවයෙහි යෙදී සිටින සියලුම නිලධාරීහු මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය, දෙපාර්තමේන්තු නියෝග හෝ රෙගුලාසි සහ රජය විසින් වරින් වර නිකුත් කරනු ලැබිය හැකි වෙනත් නියෝග හෝ රෙගුලාසිවලට යටත් විය යුත්තා හ.

2.2 අදාළ අමාත්‍යාංශයෙහි ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි ප්‍රමාණයේ මුදලක් එම ලේකම් විසින් තීරණය කරනු ලැබිය හැකි අන්දමකින් ඇප තබන ලද රාජ්‍ය සේවා නිලධාරීන්ගේ (ඇප) ආඥාපනත යටතේ රාජ්‍ය නිලධාරියකුට නියම කරනු ලැබිය හැකිය.

2.3 දිවයිනේ ඕනෑම තැනක සේවය කිරීමට රාජ්‍ය නිලධාරියෙකුට නියම කරනු ලැබිය හැකිය.

**3. ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීන්ට අදාළ සේවා කොන්දේසි :**

3.1 ස්ථිර පත්වීම් දරන රාජ්‍ය නිලධාරීහු පූර්වෝක්ත 2 වන වගන්තියේ සඳහන් කොන්දේසිවලට අතිරේක වශයෙන් පහත දැක්වෙන අනිකුත් කොන්දේසිවලටද යටත් විය යුතුය.

3.1.1 යම්කිසි තනතුරක පරිවාස කාලය අවුරුදු තුනකට වැඩි විය යුතු යැයි සලකනු ලබන්නේ නම් විනා එසේ නොමැති නම් සියලුම පත් කිරීම් අවුරුදු තුනක පරිවාස කාලයකට යටත් වනු ඇත. පරිවාස කාලය තුළ හේතුවක් නොදක්වා සේවය නතර කරනු ලැබිය හැකිය.

3.1.2 සියලුම රාජ්‍ය නිලධාරීහු රාජ්‍ය භාෂා ප්‍රතිපත්තියෙහි අවශ්‍යතාවයන් සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ IV වන පරිච්ඡේදයේ විධිවිධාන සහ රජයේ භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා දැනට පවත්නා වූ සහ මින් මතු පනවනු ලබන්නාවූ අනෙකුත් නීති, රෙගුලාසි සහ ව්‍යවස්ථා ද පිළිපැදිය යුත්තාහ.

3.1.3 රාජ්‍ය භාෂාවකින් වැඩ කිරීමට හැකිවන අන්දමේ දැනුමක් තමන්ගේ පරිවාස කාලය ඇතුළත ලබාගන්නා ලෙස සිංහල හෝ දෙමළ නොවන භාෂා මාධ්‍යයකින් රාජ්‍ය සේවයට ඇතුළත් වූ නිලධාරීන්ට නියම කෙරේ.

3.1.4 සිංහල හෝ දෙමළ හෝ නොවන වෙනත් භාෂා මාධ්‍යයකින් සේවයට ඇතුළත් වූ නිලධාරියෙකු පරිවාස කාලය අවසානයේදී තනතුරෙහි ස්ථිර කරනු ලැබීමට අදාළ වන වෙනත් කරුණු අතර, අවුරුද්දක් ඇතුළත කවර හෝ රාජ්‍ය භාෂාවකින් නියමිත ප්‍රවීනතා පරීක්ෂණයෙහි I වැනි ශ්‍රේණියෙන් සමත්වීමත්, අවුරුදු දෙකක් ඇතුළත II වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් (අවශ්‍යනම්) අවුරුදු තුනක් ඇතුළත III වැනි ශ්‍රේණියෙන් සමත්වීමත් බලපවත්වනු ඇත.

නියමිත කාල සීමා ඇතුළත දී පරීක්ෂණයකින් අසමත් වුවහොත් වැටුප් වර්ධකයක් තාවකාලිකව අත්හිටුවනු ලැබිය හැකිය. නියමිත කාලසීමාව ඉක්මවා තව මාස හයක කාල සීමාවක් ඇතුළත යථෝක්ත පරීක්ෂණයෙන් සමත්වීමට අසමත් වුවහොත් එසේ වැටුප් වර්ධක තාවකාලිකව අත්හිටුවීම, වැටුප් වර්ධක නතර කිරීමකට පරිවර්තනය කෙරෙනු ඇත. පරීක්ෂණයෙන් සමත්වන තෙක් හෝ පහත දැක්වෙන 3.1.6 වැනි වගන්තියේ විධිවිධානයන් බලපවත්වන තෙක් හෝ යථෝක්ත වැටුප් වර්ධකයන් නතර කිරීම ක්‍රියාත්මක වන්නේය.

3.1.5 මෙවැනි නිලධාරීන්ට පත්වීම ලැබීමෙන් පසු රාජ්‍ය භාෂාවක ප්‍රවීණතාවය ලබා ගැනීම පිණිස මාස හයක කාලයක් සඳහා පූර්ණ වැටුප් සහිත පහසුකම් සැළසිය යුතුය. ඉන් අනතුරුව අදාළ ප්‍රවීණතා විභාගයට ඔහු පෙනී සිටිය යුතු අතර, එම විභාගයෙන් අසමත් වුවහොත් පූර්ණ වැටුප් සහිත මාස හයක කාල පරිච්ඡේදයෙන් පසු ඒ සමගම එළඹෙන අවුරුදු දෙකක කාල පරිච්ඡේදය තුළ තමාගේ සාමාන්‍ය රාජකාරිවල නිරත වෙමින් සිටිය දී විභාගයෙන් සමත්වීමට ඔහුට අවස්ථාව සලසා දෙනු ලැබේ.

3.1.6 නියමිත අවුරුදු දෙකහමාරක කාල පරිච්ඡේදය තුළ විභාගයෙන් සමත්වීමට නොහැකි වුවහොත් ඔහුගේ සේවය අවසන් කරනු ලැබේ.

3.1.7 රාජ්‍ය සේවයෙහි ස්ථිර තනතුරක දැනටමත් ස්ථිර කරනු ලැබ සිටින රාජ්‍ය නිලධාරියෙකු රාජ්‍ය සේවයෙහි වෙනත් ස්ථිර තනතුරකට පත් කරනු ලැබූ විට යළි පරිවාස කාලසීමාවක් සේවය කරන ලෙස සාමාන්‍යයෙන් ඔහුට නියම කරනු නොලැබේ. එවැනි නිලධාරියෙකු සිය නව තනතුරෙහි කරන සේවය පරීක්ෂා කර බැලීම සඳහා ප්‍රථමයෙන් එම තනතුරෙහි නියමිත කාල සීමාවක් වැඩ බැලීම සඳහා ඔහු පත් කරනු ලැබිය හැකිය.

3.1.8 (රාජ්‍ය සේවයෙහි දැනටමත් ස්ථිර/තාවකාලික තනතුරු දරන්නාවූද වෛද්‍ය පරීක්ෂණයකට භාජනය කරනු ලැබුවා වූ ද, අය හැර) තෝරාගනු ලැබූ අපේක්ෂකයන් දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට ශාරීරිකව සුදුසුද නැද්ද යනු පරීක්ෂා කිරීම පිණිස රජයේ වෛද්‍ය නිලධාරියෙකු විසින් පවත්වනු ලබන වෛද්‍ය පරීක්ෂණයකට ඉදිරිපත්වන ලෙස ඔවුනට නියම කරනු ඇත.

**4. සේවයට භාර ගැනීම පිළිබඳ කොන්දේසි :**

4.1 ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට පත් කරනු ලබන රාජ්‍ය නිලධාරීන් විසින් ඔවුන්ගේ වැටුපෙන් අයකර ගතයුතු යයි ආණ්ඩුව විසින් නියම කරනු ලබන ප්‍රතිශතක ප්‍රමාණයට සමාන මුදලක් ස්වකීය වැටුපෙන් වැන්දඹු සහ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් වශයෙන් ගෙවිය යුතුය.

4.2 අර්ථසාධක අරමුදල් පදනම මත ස්ථිර හෝ තාවකාලික තනතුරුවලට පත්කරනු ලැබූ රාජ්‍ය නිලධාරීන් ස්වකීය ඒකාබද්ධ වැටුපෙන් 6%ක් රාජ්‍ය සේවා අර්ථසාධක අරමුදලට දායක මුදල් වශයෙන් ගෙවිය යුතු වන්නේය. මුදල් වර්ෂය අවසානයේදී අනිවාර්ය දායක මුදල් වශයෙන් අරමුදලට බැරකර ඇති මුදල් ප්‍රමාණය මෙන් 150%ක මුදල් ප්‍රමාණයක් රජය විසින් එම අරමුදලට රජයේ දායක මුදල වශයෙන් ගෙවනු ඇත.

4.3 පළාත් පාලන සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලබන රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරු උසුලන්නාවූ නිලධාරීන් සහ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදවා හරිනු ලැබ පළාත් පාලන සේවයේ (විශ්‍රාම වැටුප් සහිත) තනතුරු උසුලන්නාවූ නිලධාරීන් හට පිළිවෙළින් ඔවුන්ගේ පළාත් පාලන සේවයේ සහ රාජ්‍ය සේවයේ තනතුරු සහ විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ.

4.4 විශ්‍රාම වැටුප් ව්‍යවස්ථා සංග්‍රහය යටතේ රාජ්‍ය සේවයේ විශ්‍රාම වැටුප් සහිත තනතුරුවලට මුදලා හරිණු ලැබූ යුද්, නාවික සහ ගුවන් හමුදාවේ නිත්‍ය සේවයෙහි නියුතු පිරිසට ඔවුන්ගේ රාජ්‍ය සේවයෙහි තනතුරු සඳහා විශ්‍රාම වැටුප් හිමිකම් දෙනු ලැබේ. මෙම ව්‍යවස්ථා සංග්‍රහය යටතේ විශ්‍රාම වැටුප් සහිත බවට ප්‍රකාශිත තනතුරක රාජ්‍ය නිලධාරියෙක් ලෙස පත්වීමක් භාර ගැනීම සඳහා මුදා හරිණු ලැබූ සන්නද්ධ හමුදාව යම් සාමාජිකයෙකුගේ සම්පූර්ණ වැටුප් සහිත අහිමි නොවූ සේවා කාල සීමාව මේ ව්‍යවස්ථා සංග්‍රහයේ පටහැනිව කුමක් සඳහන්ව ඇත්ද, මේ ව්‍යවස්ථා සංග්‍රහය යටතේ ගෙවිය යුතු යම් විශ්‍රාම වැටුප් පාරිතෝෂිකයක කාර්යය සඳහා ගණන් ගත යුතුය.

**5. යුද්ධ සේවා අනුග්‍රහය :**

5.1 එක්සත් රාජ්‍ය යුද්ධාවතීරණ හමුදාවන්හි සේව මුක්ත හටයින් ද, සහය ගිනි නිවන, ගගන ප්‍රහාර නිවාරණ සහ මහජන ආරක්ෂක සේවාවන්හි පූර්ණකාලීන සාමාජිකයන් වශයෙන් නියුක්තව සිටි තමන්ගේම ඕනෑකමින් එම සේවාවන්ගෙන් අස්ව නොගිය අයටද ඉහත කී සියලු සුදුසුකම් තිබේ නම් ද ඔවුන් මෙම හමුදාවන්ට බැදී ඇත්තේ 1954 අගෝස්තු මස 15 වැනි දිනට පෙරාතුව නම්ද, ඔවුන්ගේ එස සේවාවන් සතුටුදායක ලෙස සහ අඛණ්ඩව පැවතිණි නම්ද, වයස අතින් සුදුසුකම් ලබා ගැනීම සඳහා ඔවුන්ට තමන්ගේ වයස්වලින් 1939 සැප්තැම්බර් මස 3 වැනි දින සිට 1949 දෙසැම්බර් මස 31 වැනිදා දක්වා වූ කාල සීමාව තුළ තම තමන් සේවය කළ කාලයන් අඩුකර ගැනීමට ඉඩදෙනු ලැබේ.

**6. රාජ්‍ය සේවයෙහි දැනට සේවය කරන නිලධාරීහු :**

6.1 රාජ්‍ය සේවයෙහි දැනට සේවයෙහි යෙදී සිටින්නාවූත්, අවශ්‍ය සියලු සුදුසුකම් ඇත්තාවූත්, නිලධාරීන් විසින් ඉදිරිපත් කරන අයදුම්පත් ඔවුන්ගේ, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ගේ මාර්ගයෙන් එවිය යුතුය. නව තනතුරු සඳහා ඉල්ලුම් කරන්නා වූ ද, රාජ්‍ය සේවයෙහි දැනට ස්ථිර තනතුරු දරන්නාවූ ද, නිලධාරීන්ගෙන් යමෙකු නව තනතුරකට තෝරාගනු ලැබුවහොත් ඒ සඳහා ඔවුන් මුදවාලිය හැකි ද නොහැකිද යන්න එම නිලධාරීන් සේවයෙහි යෙදී සිටින දෙපාර්තමේන්තුවල ප්‍රධානීන් විසින් ඔවුන්ගේ අයදුම්පත් ඉදිරිපත් කරන විට සඳහන් කළ යුතුය.

6.2 නියමිත වේලාවක නියමිත ස්ථානයක දී සම්මුඛ පරීක්ෂණයක් සඳහා පෙනී සිටින ලෙස අයදුම්කරුවන්ට නියම කරනු ලැබිය හැක. මේ සම්බන්ධයෙන් දැරීමට සිදුවන ගමන් වියදම් හෝ වෙනත් වියදම් ආදියත් ගෙවනු නොලැබේ.

6.3 යම්කිසි අයදුම්කරුවකු නිර්දේශ කිරීමට අදහස් කරන කෙනෙකු විසින් අයදුම්කරුට චරිත සහතිකයක් දීමෙන් එසේ කළ යුතුය. යම් අයදුම්කරුවකු තෝරා ගන්නා පරිද්දෙන් කවර අන්දමේ වුවද අයථා අනුග්‍රහයන් පැතීම හෝ එහිලා යම් බලපෑමක් කිරීමට තැත් කිරීම හෝ එම අයදුම්කරු නුසුදුස්සකු කරනු ලැබීමට හේතුවනු ඇත.

6.4 අයදුම්කරුගේ අයදුම්පතෙහි කිසියම් සාවද්‍ය ප්‍රකාශයක් තිබෙන බැව් ඔහු තෝරා ගැනීමට කළින් දැනට ගන්නට ලැබුණි නම් ඒ හේතුවෙන් ඔහු එම තනතුරට නුසුදුස්සකු බවට පත් කරනු ලැබීමටත් තෝරා ගැනීමෙන් පසු ඒ බව අනාවරණය වුණි නම් ඔහු රාජකාරියෙන් පහකරනු ලැබීමටත් ඉඩ තිබේ.

6.5 මෙම දැන්වීමෙහි සඳහන් වන නියමයන්ට සෑම අතින්ම අනුකූල නොවන අන්දමේ අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

**7. සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප් යන්නෙහි අර්ථ දැක්වීම :**

7.1 සුදුසුකම් පිළිබඳ අවශ්‍යතාවයන් සඳහා වැටුප යන්නෙන් අදහස් කෙරෙනුයේ ඒකාබද්ධ වැටුප පමණකි. වැඩ බැලීමේ වැටුපක් හෝ දීමනා ආදිය ඊට ඇතුළත් නොවන්නේය.

**8. බඳවා ගැනීම සහ උසස් කිරීම සම්බන්ධ නව ජාතික ප්‍රතිපත්තිය :**

පසුව නිකුත් කෙරෙන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ මගින් සංශෝධනය කිරීමට යටත්ව 1990.08.09 දිනැති අංක 15/90, 1990.03.05 දිනැති අංක 15/90(I) සහ 1990.06.15 දිනැති අංක 15/90 (II) දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛවල දක්වා ඇති ප්‍රතිපත්තියට අනුකූලව රාජ්‍ය සේවයට, පළාත් රාජ්‍ය සේවයට රාජ්‍ය සංස්ථා අංශයට සහ රජයට සම්පූර්ණයෙන්ම අයත් සමාගම්වලට බඳවා ගැනීම සහ උසස් කිරීම 1990.01.01 දින සිට සිදුකරනු ඇත.

# විභාග අපේක්ෂකයන් සඳහා නීති සහ උපදෙස්

"1968 අංක 25 දරන විභාග පනතේ දක්වා ඇති විධිවිධානයන්ට අනුකූලව කටයුතු කිරීමට සියළුම විභාගාපේක්ෂකයින් බැඳී ඇත"

සියලුම විභාගාපේක්ෂකයින් පහත සඳහන් නීති පිළිපැදීමට බැඳී සිටිය යුතුය. මේ නීති කිසිවක් උල්ලංඝනය කරන විභාගාපේක්ෂකයෙකුට විභාග කොමසාරිස්ට අභිමත පරිදි පහත සඳහන් දඬුවම් එකක් හෝ ඊට වැඩි ගණනක් හෝ පමුණුවනු ලැබේ.

i. මුළු විභාගයම හෝ ඉන් කොටසකට හෝ නැතහොත් එක් විෂයයකට හෝ ඉන් කොටසට හෝ පෙනී සිටීම හෝ තහනම් කිරීම.
ii. විභාගයේ එක් විෂයයකට හෝ මුලු විභාගයටම හෝ නුසුදුස්සෙකු කිරීම.
iii. එක් අවුරුදු හෝ අවුරුදු දෙකකට හෝ කිසිම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
iv. මුළු ජීවිත කාලයේම විභාගයකට පෙනී සිටීම තහනම් කිරීම.
v. සහතික පත්‍රය යම්කිසි කාල සීමාවක් තුළ තහනම් කිරීම.
vi. විභාගාපේක්ෂකයාගේ ක්‍රියා පරිපාටිය සම්බන්ධයෙන් ඔහු ගැන වග කිවයුත්තන්ට සැලකර සිටීම හෝ විභාගාපේක්ෂකයාගේ පොලීසියට භාරදීම හෝ ඔහුගේ ක්‍රියාව සම්බන්ධයෙන් පොලීසියට පැමිණිලි කිරීම.

විභාගයට කලින් හෝ විභාගය පවත්වාගෙන යන අතරතුරු හෝ විභාගයට පසුව හෝ කොයිම අවස්ථාවකදි වුවත් එවැනි විභාගපේක්ෂකයෙකු සම්බන්ධයෙන් ක්‍රියා කිරීමේ බලය විභාග කොමසාරිස් සතුවේ. ඒ සම්බන්ධයෙන් ඔහුගේ තීරණය අවසාන තීරණය වන්නේය. එහෙත් රජයේ සේවකයන් බඳවා ගැනීම සඳහා පවත්වනු ලබන විභාග පිළිබඳව විභාග කොමසාරිස්ගේ තීරණය රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ සමීක්ෂණයට යටතේ වන්නේය.

1. සියළුම විභාගාපේක්ෂකයන් විභාග ශාලාව තුළදීත් ඒ අසළදීත් විභාගශාලාධිපතින්ට ද, ඔහුගේ සහාකාරයින්ට ද, අනිකුත් විභාගාපේක්ෂකයින්ට ද බාධාවක් හෝ අවහිරයක් හෝ ඇති නොවන ලෙස ශාන්තදාන්තව හැසිරිය යුතුය. විභාග ශාලාවට ඇතුළු වන විටත්, ඉන් පිටවන විටත් ඉතා සන්සුන් ලීලාවෙන් හැසිරිය යුතුය.

2. විභාගාපේක්ෂකයෝ විභාගශාලාධිපතීන්ට කීකරු විය යුත්තාහ. එබැවින් ඔවුන් විභාගය පවත්වාගෙන යන අතරතුරත්, විභාගය පටන් ගැනීමට පෙරත්, විභාගය අවසන් වූ විගසත් විභාගශාලාධිපතින්ගේ හා ඔහුගේ සහකාරයන්ගේ උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

3. විභාගයේදී ප්‍රශ්න පත්‍රයකට උත්තර ලිවීම පටන්ගෙන පැය භාගයක් ගතවුවාට පසු මොනම කාරණයක් නිසාවත් විභාගාපේක්ෂකයෙකු විභාග ශාලාවට ඇතුලු කරගනු නොලැබේ. විභාගය පටන් ගෙන පැය භාගයක් ගතවන තුරු ප්‍රශ්න පත්‍රයට පෙනී සිටින අපේක්ෂකයෙකුට විභාග ශාලාවෙන් පිටවී යාම තහනම්ය. ප්‍රායෝගික පරීක්ෂණවලට හෝ වාචික පරීක්ෂණවලට පමාවී පැමිණෙන අපේක්ෂකයන් විභාග ශාලාවට ඇතුළු නොකිරීමට ඉඩ තිබේ.

4. සෑම විභාගාපේක්ෂකයෙකුම තමාගේ විභාග අංකය දරන ආසනයේ හැර වෙන කිසිම තැනක වාඩි නොවිය යුතුය. විභාශාලාධිපතිනේ විශේෂ අවසරය නොමැතිව තමන්ගේ ස්ථානය වෙනස් නොකළ යුතුයි. තමන්ට නියම නොකරන ලද අසුනක් ගැනීම වංචනික අදහසින් කරන ලද ක්‍රියාවක් වශයෙන් සලකනු ලැබීමට අවකාශයකි.

5. විභාග ශාලාව තුළ සම්පූර්ණයෙන්ම නිශ්ශබ්දව සිටිය යුතුය. මොනම කාරණයක් නිසාවත් විභාග ශාලාව ඇතුළත දි විභාග ශාලාවේ කාර්ය මණ්ඩලයේ කෙනෙකු සමග හැර, විභාග ශාලාව ඇතුළත හෝ පිටත් හෝ සිටින කිසිවකු සමග මොනයම් කරුණක් නිසාවත් කතාබස් කිරිම හෝ පණිවුඩ හුවමාරු කර ගැනීම හෝ වෙනත් අන්දමේ ගනුදෙනු කිරීම හෝ සම්පූර්ණයෙන්ම තහනම්ය. යම් කිසි හදිසි වුවමනාවක් සඳහා කිසිවෙකු සමග කතාබස් කිරීම් ආදියත් අවශ්‍ය වුවහොත් ප්‍රථමයෙන් ඒ සඳහා විභාගශාලාධිපතින්ගේ අවසරය ලබා ගත යුතුයි.

6. විභාගාපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රය හඳුනාගනු ලබන්නේ ඔහුගේ විභාග අංකයෙන් පමණක් හෙයින් උත්තර පත්‍රවල තමන්ගේ නම නොලිය යුතුයි. තමාගේ උත්තර පත්‍රයෙහි අන්‍ය විභාගාපේක්ෂකයෙකුගේ විභාග අංකය ලිවීම වංචනික ක්‍රියාවක් කිරීමට ප්‍රයන්ත දැරීමක් ලෙස සළකනු ලැබේ. හඳුනාගත නොහැකි පරිදි විභාග අංකය ලියා ඇති උත්තර පත්‍ර ප්‍රතික්ෂේප කිරීමටද සිදුවෙනවා ඇත.

7. තමන් වෙත සපයන ලද කඩදාසි හැර තීන්ත පොවන කඩදාසියෙහි හෝ ප්‍රශ්න පත්‍රයෙහි හෝ මේසය මත හෝ වෙන කිසි තැනක හෝ කිසිවක් නොලිය යුතුය. මේ නීතිය නොසැලකීම වංචනික චේතනාවකින් යුක්තව ක්‍රියා කිරීමකැයි සැළකිය හැකිවේ.

8. තමන් වෙත සපයන ලද කඩදාසියක් හෝ උත්තර ලියන පොතක් හෝ ඉරාදැමීම හෝ පොඩි කිරීම හෝ නමා දැමීම හෝ අකාමකා දැමීම හෝ නොකළ යුතුය. කටුවැඩි ආදිය සඳහා පාවිච්චි කරන ලද සෑම කඩදාසියක්ම උත්තර පත්‍රයට ඇමිණිය යුතුය. ඒවා උත්තර පත්‍රයෙහිම කොටසක් විය යුතුය. (එබඳු කටුවැඩ පැහැදිලි ලෙස කපා හැරිය යුතුයි. විභාග ශාලාවේදී ලියන ලද කියන

9. ගණිත ප්‍රශ්නවලදී ගණන් වරදවා සාදා හෝ ගණනක් කොහෙත්ම නොසාදා හෝ නිවැරදි පිළිතුරු දැක්වීමක් චිත්‍ර කර්මයේදී තමන්ගේ චිත්‍රය තවත් අපේක්ෂකයෙකුගේ චිත්‍රයට ආකල්ප මාත්‍රයෙන් හෝ ස්වරූපයෙන් හෝ ක්‍රියාකාරිත්වයෙන් හෝ යනාදියකින් සමානව, එසේ නැතිනම් බොහෝ සෙයින්ම කිට්ටුවම තිබීමත්, වංචා සහගත ක්‍රියාවක් සේ සළකනු ලැබීමට හේතු විය හැකිය.

10. විභාගයේදි උත්තර ලිවීම සඳහා තමන්ට සපයනු ලබන කඩදාසි හෝ වෙනත් ද්‍රව්‍ය විභාග ශාලාවෙන් පිටතට ගෙනයාම තහනම්ය. මේ සියලුම දෑ විභාග කොමසාරිස් සතුය. මේ නීතිය කඩකිරීම වංචනික චේතනාවකින් යුත් ක්‍රියාවක් ලෙස සැළකීමට හේතු විය හැකිය.

11. තමන් වෙත සපයන ලද ලිපි ද්‍රව්‍ය හැර වෙනත් පොත්පත්, සටහන් පොත්, සාක්කුවේ පාවිච්චි කරන නෝට් පොත්, ඇක්සයිස් පොත් හා කඩදාසි කොල හො කැබලි ද, තමන්ගේ පාට පෙට්ටි හා පාර්සල් ආදිය ද, පයිල් කවර, කාඩ්බෝඩ් පෑඩ්, නැවූ ප්‍රවෘත්ති පත්‍ර, බ්‍රවුන් පේපර් යනාදිය ද, විභාග ශාලාව තුළ සිටින කිසි විටෙක තමා වෙත සමීපයෙහි හෝ තබා නොගත යුතුය. මේ නීතිය කඩ කිරීම දඬුවම් ලැබිය හැකි ක්‍රියාවකි.

12. විභාග ශාලාව තුළ කිසිම අපේක්ෂකයෙකු අත කිසිම පොත් පතක් හෝ සටහන් පොතක් හෝ සටහන් ලියන කඩදාසියක් හෝ තබා ගැනීම සම්පූර්ණයෙන්ම තහනම් ය. විභාගශාලාධිපතීන් නියම කළහොත් සෑම අපේක්ෂකයාම තමන් සන්තකව තිබෙන දෑ මේ මේ යයි සහතික කිරීමට බැඳී සිටි. මේ අවශ්‍යතා කඩකිරීම වංචා සහගත ක්‍රියාවක් කිරීමට යත්ත දැරීමක් ලෙස සළකනු ලැබේ.

13. වෙනත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයකින් හෝ පොත පතකින් හෝ ප්‍රතයකින් හෝ සටහන් සහිත කොලයකින් හෝ වෙන කිසිවකින් හෝ ගෙන හොර උත්තර ලිවීම හෙවත් කොපි කිරීම හොර උත්තර ලීවීමට ද, යන්න දැරීම තහනම් ය. තවත් අපේක්ෂකයෙකුගේ උත්තර පත්‍රයක් දෙස බැලීම ද නොකළ යුතුය. වෙන අයදුම්කරුවෙකුට උදව් දීමෙන් ද, වෙන අයදුම්කරුවෙකුගෙන් හෝ පුද්ගලයෙකුගෙන් හෝ උදව් ලබා ගැනීමෙන් ද සම්පූර්ණයෙන්ම වැළකිය යුතුය. උත්තර ලියා සම්පූර්ණ වූ සෑම කඩදාසියක්ම ලියමින් සිටින කඩදාසි යට තබා ගත යුතුය. ලියන කඩදාසි මේසය මත විසුරුවා නොදැමිය යුතුය.

14. ප්‍රශ්න පත්‍රයකට උත්තර ලියන අතරතුර මොනම කරුණක් නිසාවත් ස්වල්ප වේලාවකටවත් විභාග ශාලාවෙන් පිටවී යාමට කිසිම අපේක්ෂකයෙකුටම ඉඩදෙනු නොලැබේ. එහෙත් යම්කිසි හදිසි කරුණක් නිසා විභාගාපේක්ෂකයෙකුට ඉන් පිටත යන්නට උවමනා වුවහොත් විභාග ශාලාධිපතිගේ සහකාර නිලධාරියෙකුගේ සුපරීක්ෂාකත්වය යටතේ විභාග ශාලාවෙන් ඔහුට ස්වල්ප වේලාවකට පිටතට යාමට අවසර දෙනු ලැබේ. එසේ පිටතට යාමට පෙරත් නැවත විභාග ශාලාවට ඇතුළු වන විටත් ඔහු සෝදිසියකට භාජනය විය යුතුය.

15. විභාග ශාලාවේදී පිළිතුරු පිළිතුරු ලියන විට විභාගය පටන් ගැනීමට පෙර හෝ නියම විභාග අපේක්ෂකයකු වෙනුවට ව්‍යාජ අපේක්ෂකයෙකු පෙනී සිටීම දඬුවම් ලැබිය යුතු ක්‍රියාවකි. අනන්‍යතා පත්‍ර වෙනස් කිරීම හෝ බොරු අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කිරීමත් කෙනෙකුගේ අනන්‍යතා සහතිකයේ වෙනස් කිරීමක් එබඳු වරදවල් ය. විභාගාපේක්ෂකයනී එවැනි වරදට අසු නොවිය යුතුය.

16. විභාග අපේක්ෂකයෙකු නොවන අයෙක් කිසිම අපේක්ෂකයෙකුට අයථා අන්දමින් වංචා සහගත ලෙස උදව් දීම බරපතල වරදක් ලෙස සළකනු ලැබේ.

විභාග අපේක්ෂකයන් විසින් තමන්ගේ පරෙස්සම සඳහා පහත සඳහන් උපදෙස් අනුව ක්‍රියා කළ යුතුය.

i. විභාගය පටන් ගන්නා නියමිත වේලාවට සෑහෙන් පමණ කලින් විභාග ශාලාවට පැමිණෙන්න. එක් එක් ප්‍රශ්න පත්‍රය පටන් ගැනීමට නියමිත වේලාවට යටතේ පිරිසෙයින් විනාඩි 10කට හෝ 15කට කලින් විභාග ශාලාවට පැමිණ සිටීම සෑහේ. විභාග ශාලාව පිහිටා ඇති ස්ථානය හරිහැටි නොදත් විට විභාගය පටන් ගන්නා දිනයට කලින් ඒ ගැන සොයා බලා නියම ස්ථානය හරි හැටි දැන සිටිය යුතුය.

ii. යම්කිසි විෂයයකට ඇතුළත්වීම ගැන හෝ යම් විෂයයකට පෙනී සිටීමට ඇති සුදුසුකම් ගැන හෝ සැකයක් ඇති වූ විට එම ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සැපයීමට පටන් ගැනීමට පෙර විභාගශාලාධිපතින්ට ඒ බැව් සැළකර එම සැකය දුරුකර ගත යුතුයි. එලෙස ක්‍රියා නොකිරීම එම විෂයය හෝ විෂයයන් සම්බන්ධයෙන් තමන්ගේ විභාගපේක්ෂකත්වය අවලංගුවී යාමට හේතු විය හැකිය.

iii. විභාගයට පෙනී සිටීමේදී අපේක්ෂකයන් සෑම විෂයයකටම පෙනී සිටින විට අනන්‍යතා පත්‍ර ඉදිරිපත් කළ යුතුය. අනන්‍යතාවය ඔප්පු කිරීම සඳහා අවශ්‍ය ලියවිලි විභාග ශාලාවේදී ඉදිරිපත් නොකළහොත් ඔහුගේ විභාගාපේක්ෂකත්වය අවලංගු කිරීමට ඉඩ තිබේ. යම් හෙයකින් ඒ සඳහා අවශ්‍ය ලියවිලි විභාගශාලාවට ගෙන ඒමට අමතක වුවහොත් ඒ බැව් විභාගශාලාධිපතින්නට දන්වා විභාග අවසන් වීමට පෙර එය ඉදිරිපත් කිරීමට මං සළසා ගත යුතුය.

iv. විභාගය සඳහා සාමාන්‍යයෙන් සම්මත වර්ගයකට අයත් ලිපි ද්‍රව්‍ය (එනම්, ලියන කඩදාසි, තීන්ත පොවන කඩදාසි, ලැජර් කඩදාසි, සාරාංශ ලියන කඩදාසි) ආදිය සපයනු ලැබේ. සාමාන්‍යයෙන් කාටත් බෙදා දෙන වර්ගයකට වෙනස් වූ හෝ අමුතු මොස්තරයක ලිපි ද්‍රව්‍ය ඔබට ලැබුණහොත් ඒ බව නොපමාව විභාගශාලාධිපතිට දැන්විය යුතුයි. විභාග ශාලාවේදී ඔබට දෙනු ලබන කඩදාසි හැර වෙන මොනම කඩදාසියක්වත් ප්‍රශ්නවලට උත්තර ලිවීම සඳහා පාවිච්චි නොකළ යුතුයි. ඉතිරි වන කඩදාසි සහ වෙනත් ද්‍රව්‍ය අපිරිසිදු නොකර නැවත ප්‍රයෝජනයට ගත හැකි වන සේ ඔබගේ ලියන මේසය මත තබන්න. ඔබට ලඝුසණක චක්‍ර සපයන ලද නම් ඒවා පරිස්සමින් පාවිච්චි කොට ඔබේ ලියන මේසය මත තිබෙන්නට හැරිය යුතුය.

v. විභාගාපේක්ෂකයන් තම තමන්ගේ පෑන්, පැන්සල්, තීන්ත කුඩු, මකන, රෙදි කෑළි, අඩිකෝදු, ජ්‍යාමිතික උපකරණ, පාට පැන්සල් පෙට්ටි, පාට හුණු පෙට්ටි යනාදිය රැගෙන ආ යුතුයි.

vi. තමන් පාවිච්චි කරන සෑම කඩදාසියකම පිළිතුරු ලිවීමට පටන් ගැනීමේදී නොපමාව තන්ගේ විභාග අංකය හා විභාගයේ නමත් පැහැදිලි ලෙස ලියන්න. කඩදාසියේ දෙපැත්තේම පැහැදිලිව ද පිරිසිදුව ද උත්තර ලියන්න. ප්‍රශ්නයක කොටසකට උත්තර ලිවීමෙන් පසු අනික් කොටස පටන් ගැනීමට පෙර එක රූලක්වත් හිස්ව තිබිය යුතුයි. සම්පූර්ණ ප්‍රශ්නයකට උත්තර ලිවීමෙන් පසු රූලක් හෝ රූල් කීපයක් හෝ හිස්ව තබන්න. ලියන සෑම දෙයක්ම එක ගොඩේ තෝරා බේරා ගන්නට නොහැකි ලෙස නොලිය යුතුයි.

vii. උත්තර ලියන කඩදාසියෙහි වම් පැත්තේ තීරය වෙන්කර ඇත්තේ ප්‍රශ්නවල අංක ලිවීම සඳහා ය. දකුණු පැත්තේ තීරය වෙන්කර ඇත්තේ පරීක්ෂකවරයාගේ ප්‍රයෝජනය සඳහා බැවින් එහි කිසිවක් නොලිවිය යුතුයි. තමන් විසින් උත්තර ලියන ලද ප්‍රශ්නවල අංක වරදවා යෙදීම ව්‍යාකූලත්වයට හේතුවන බැවින් ප්‍රශ්න අංක ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

viii. අනිවාර්ය ප්‍රශ්න ද, තෝරා ගත යුතු අන් ප්‍රශ්න ද සම්බන්ධව ප්‍රශ්න පත්‍රයේ මුලින්ම සඳහන් කොට ඇති උපදෙස් ඉතා පරෙස්සමින් නිවැරදි ලෙස යෙදිය යුතුය.

ix. ගණිත ප්‍රශ්නවලට උත්තර සපයන විට ගැන බැලීම සහ කටුවැඩ ඒ ඒ ගණන් සෑදීමේ කොටසක් වශයෙන් අනුක්‍රමයෙන් විස්තර ලෙස දැක්විය යුතුය. අවශ්‍ය තැන්වල අඳිනු ලබන රූප සටහන් හා චිත්‍ර ආදිය නිවැරදිව සෑහෙන පමණ විශාලවද තිබිය යුතුයි. පිටු කීපයකට යන දිග පිළිතුරුවලදී එක පිටුවක අඳින ලද රූප සටහන් සම්බන්ධයෙන් ඊළඟ පිටුවලදීත් සිත් යොමුකර විය යුතු අවස්ථාවලදීත් ඒ රූප සටහන් නැවතත් ඇඳ පෙන්වීම යෝග්‍ය වේ.

x. එක් එක් ප්‍රශ්න පත්‍රයට පිළිතුරු සපයා අවසන් වූ විට උත්තර ලියන ලද කඩදාසි සියල්ලම ප්‍රශ්නවලට උත්තර ලියූ පිළිවෙල අනුව එකතුකොට වම් පැත්තේ ඉහළ කෙළවරවල් තමන්ට සපයන ලද නූල් කැබැල්ලෙන් නොගැලවී යන පරදි එකට තබා අමුණා ගැටගසන්න. දකුණු පැත්තේ උඩ කෙළවරවල් එකට තබා ගැට නොගසන්න.

xi. ඔබගේ උත්තර පත්‍රය විභාගශාලාධිපතින්ට හෝ ඔවුන්ගේ සහකාර මහතකුට හෝ සියතින්ම භාරදිය යුතුය. නැතහොත් ඒවා එකතු කරන තුරු ඔබේ අසුනේම වාඩිවී සිටිය යුතුය. මෙසේ නොකරීම ඇතැම් විට ඔබගේ උත්තර පත්‍රය නැතිවී යාමටද ඔබ යම් විෂයයකට ඉදිරිපත් නොවුවකු සේ සලකණු ලැබීමටද හේතු විය හැකිය. මොනම කරුණක් නිසාවත් ඔබගේ උත්තර පත්‍රය විභාග ශාලාවේ සේවය කරන පියන් කෙනෙකුට හෝ වෙනයම් සේවකයකුට හෝ බාර නොදිය යුතුය.

xii. යම්කිසි කරුණක් නිසා විභාග ශාලාධිපතින්ට හෝ ඔහුගේ සහකාර මහතෙකුට හෝ කථා කිරීමට අවශ්‍ය වූ විටද කඩදාසි ආදිය අවශ්‍ය වූ විටද තම ආසනයෙන් නොනැගිට අත පමණක් එසවිය යුතුය.

විභාග කොමසාරිස් ජනරාල්.

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව,
පැලවත්ත,
බත්තරමුල්ල.

# තනතුරු - ඇබෑර්තු

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු මාතලේ දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 ජනවාරි මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 නොවැම්බර් මස 18 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| 01. මාතලේ | උකුවෙල | මාතලේ උඩසියපත්තුව දකුණ කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ මාතලේ දකුණ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් මාතලේ |
| 02. මාතලේ | දඹුල්ල | වනපනහ පල්ලේසිය-පත්තුව කොට්ඨාසයේ | එම |

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| | | උප්පැන්න මරණ සහ මාතලේ උතුර කොට්ඨාසයේ සහ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් මාතලේ |
| 03. මාතලේ | දඹුල්ල | ඉනාමළුව කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ මාතලේ උතුර කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 04. මාතලේ | රත්තොට | මාතලේ උඩසියපත්තුව උතුර කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ මාතලේ දකුණ කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 05. මාතලේ | ලග්ගල-පල්ලේගම | ලග්ගල උඩසියපත්තුව කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ මාතලේ නැගෙනහිර කොට්ඨාසයේ විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 06. මාතලේ | පල්ලේපොල | උඩුගොඩ උඩසියපත්තුව බස්නාහිර කොට්ඨාසයේ උප්පැන්න මරණ සහ මාතලේ උතුර විවාහ (උඩරට/සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |

12-268

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු — මහනුවර දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාසවල ඇති මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල විවාහ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුයි.

03. මෙම තනතුරු සඳහා මුස්ලිම් පුරුෂ පක්ෂයට පමණක් ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

05. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරි කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

06. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

07. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 ජනවාරි මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මඟින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 නොවැම්බර් මස 18 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

### උපලේඛනය

| දිස්ත්‍රික්කය | ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර | ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය |
|---|---|---|---|
| 01. මහනුවර | යටිනුවර | උඩුනුවර හා යටිනුවර කොට්ඨාසයේ දෙහිඅංග මුරුතලාව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් මහනුවර |
| 02. මහනුවර | දොළුව | උඩපලාත කොට්ඨාසයේ කළුගමුව ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 03. මහනුවර | පාතහේවා-හැට | පාතහේවාහැට කොට්ඨාසයේ උඩදෙනි ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 04. මහනුවර | දෙල්තොට | පාතහේවාහැට කොට්ඨාසයේ දෙල්තොට ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 05. මහනුවර | මහනුවර සහ ගඟවට-කෝරලය | කඩවත්සතර හා ගඟවට කොට්ඨාසයේ තැන්නේකුඹුර ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 06. මහනුවර | ගඟඉහල කෝරලය | උඩපලාත කොට්ඨාසයේ උලපනේ ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල් මහනුවර |
| 07. මහනුවර | උඩපලාත | උඩපලාත කොට්ඨාසයේ ගම්පොල නගරය ප්‍රදේශයේ මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 08. මහනුවර | පූජාපිටිය | හාරිස්පත්තුව කොට්ඨාසයේ බුළුගොහොතැන්න මුස්ලිම් විවාහ රෙජිස්ට්‍රාර් ධුරය | එම |

12-269

---

## රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව

### විවාහ, උප්පැන්න හා මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු — ගාල්ල දිස්ත්‍රික්කය

මෙහි පහත උපලේඛනයේ සඳහන් කොට්ඨාශවල ඇති විවාහ, උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ රෙජිස්ට්‍රාර් තනතුරු සඳහා ඉල්ලුම්පත් කැඳවනු ලැබේ.

02. ඉල්ලුම්කරුවන් අදාල උප්පැන්න සහ මරණ ලියාපදිංචි කිරීමේ කොට්ඨාස තුල ස්ථිර පදිංචියක් ඇත්තාවූ හා සැහෙන දේපලක් හිමි ප්‍රදේශ වාසීන්ගේ සැලකිල්ල ලබන අයද විය යුතුය.

03. මෙම තනතුරු සඳහා ස්ත්‍රී/පුරුෂ දෙපක්ෂයටම ඉල්ලුම් කළ හැකිය.

04. ඉල්ලුම්කරුවන්ගේ වයස අවුරුදු 21ට අඩු නොවිය යුතු අතර, අවුරුදු 65ට වැඩි නොවිය යුතුය.

05. ඉල්ලුම්කරුවන් විවාහක අය විය යුතුය.

06. අධ්‍යාපන හා අනෙකුත් සුදුසුකම් ආදිය පිළිබඳ අමතර විස්තර අදාල දිස්ත්‍රික් ලේකම් කාර්යාල, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාල, ප්‍රාදේශීය ලේකම් කාර්යාල, ග්‍රාම නිලධාරී කාර්යාල, ග්‍රාම සංවර්ධන සමිති සහ සමුපකාර සමිති ආදී කොට්ඨාසයේ ප්‍රසිද්ධ ස්ථානවල ප්‍රදර්ශනය කර ඇති දැන්වීම් වලින් බලාගත හැකිය.

07. මේ සඳහා අවශ්‍ය ඉල්ලුම්පත් අදාල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම් (දිසාපති) කාර්යාලයෙන් සහ ඉඩම් සහ දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලයෙන් ලබාගත හැක.

08. සම්පූර්ණ කරන ලද ඉල්ලුම්පත් 2009 ජනවාරි මස 26 වැනි දින හෝ එදිනට පෙර උපලේඛනයේ සඳහන් ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපැල් මගින් යැවිය යුතුය.

ඊ. එම්. ගුණසේකර,
රෙජිස්ට්‍රාර් ජනරාල්.

2008 නොවැම්බර් මස 18 වැනි දින,
බත්තරමුල්ල, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවත,
අංක 234/ඒ3,
රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුවේ දී ය.

**උපලේඛනය**

| *දිස්ත්‍රික්කය* | *ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය* | *ඉල්ලුම්පත් කැඳවන කොට්ඨාසය හා තනතුර* | *ඉල්ලුම්පත් යැවිය යුතු ලිපිනය* |
|---|---|---|---|
| 01. ගාල්ල | ඇල්පිටිය | අම්බන කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ බෙන්තර වලල්ලාවිට කෝරල කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |
| 02. ගාල්ල | නියාගම | නියාගම කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ බෙන්තර වලල්ලාවිට කෝරල කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 03. ගාල්ල | හබරාදූව | උණවටුන කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ තල්පෙපත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 04. ගාල්ල | බලපිටිය | අහුන්ගල්ල කොට්ඨාසයේ මරණ සහ බෙන්තර වලල්ලාවිට කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 05. ගාල්ල | නාගොඩ | මාපලගම ඇතුමලේ කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ ගඟබඩපත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 06. ගාල්ල | බෙන්තොට | ඉඳුරුව කොට්ඨාසයේ උප්පැන්න, මරණ හා බෙන්තර වලල්ලාවිට කෝරළය කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |
| 07. ගාල්ල | කරන්දෙණිය | කරන්දෙණිය නැගෙනහිර කොට්ඨාසයේ උප්පැන්න,මරණ සහ වැල්ලබඩ පත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | දිස්ත්‍රික් ලේකම්/ අතිරේක රෙජිස්ට්‍රාර් ජනරාල්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලය, ගාල්ල. |
| 08. ගාල්ල | අක්මීමන | පිලාන/මැටරඹ කොට්ඨාසයේ උප්පැන්න, මරණ සහ තල්පෙපත්තුව කොට්ඨාසයේ විවාහ (සාමාන්‍ය) රෙජිස්ට්‍රාර් ධුරය | එම |

12-620

---

**ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව**

විශේෂ කාර්ය බලකායේ පොලිස් කොස්තාපල්, හා පොලිස් රියදුරු තනතුර

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ විශේෂ කාර්ය බලකායේ ආධුනික පොලිස් කොස්තාපල් හා පොලිස් කොස්තාපල් රියදුරු තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයැදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්. ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, පළමු මහල, නො. 375, මයා මාවත , කොළඹ 06 යන ලිපිනයට එවිය යුතුය. අයැදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින් තමා අයැදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2008.03.31 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයැදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයැදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයැදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. වැටුප් ක්‍රමය :

*ආධුනික පොලිස් කොස්තාපල් තනතුර :*

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2160 - 17 x 2,880 - රු. 2, 54,100

*ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර :*

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2160 - 17 x 2,880 - රු. 2, 54,100

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

(අ) විශේෂ දුෂ්කර දීමනා -

1. මෙහෙයුම් කලාපවල සේවය සඳහා රු. 1,200
2. මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා රු. 600

(ආ) සංයුක්ත දීමනා -

1. මෙහෙයුම් කලාපවල සේවය සඳහා රු. 10,500
2. මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා රු. 3,500

(අ) නොමිලේ ගමන් පහසුකම්,

(ආ) නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක),

(ඇ) සියලුම නිළ ඇඳුම් නොමිලේ සපයනු ලැබේ,

(ඈ) තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්,

(ඉ) රාජකාරි සඳහා ගමන් වියදම්, දුෂ්කර සේවය හා විශිෂ්ඨ රාජකාරී සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. අවශ්‍ය මූලික සුදුසුකම් :

(අ) වයස් සීමාව -

* ආධුනික පොලිස් කොස්තාපල් තනතුර

ගැසට් නිවේදනය අනුව අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 - 25 ත් අතර විය යුතුය. එසේ වුවද දැනට පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරියේ නියුතු ආරක්ෂක සහායක නිලධාරීන්ට අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයැදුම්කළ හැක.

* ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර :

ගැසට් නිවේදනය අනුව අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 19 - 26 ත් අතර විය යුතුය. එසේ වුවද දැනට පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරියේ නියුතු ආරක්ෂක සහායක නිලධාරීන්ට අයැදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයැදුම්කළ හැක.

(ආ) අධ්‍යාපන සුදුසුකම් -

* ආධුනික පොලිස් කොස්තාපල් තනතුර

* අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී එකවර විෂයයන් 05කින් සමත් විය යුතුය.

* ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර

* අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී එකවර විෂයයන් 05කින් සමත් විය යුතුය.

*සටහන 01.*—ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂය යුගලය එක් විෂයයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන්ද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02.*—අ. පො. ස. (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03.*—වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ. පො. ස. (සා. පෙළ) විෂය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) *ශාරීරික සුදුසුකම්*—

* ආධුනික පොලිස් කොස්තාපල් තනතුර :

* උස අඩි 05 අඟල් 04 (අවම)
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා)

* ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර :

* උස අඩි 05 අඟල් 03 (අවම)
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා)

*සටහන.*— විශිෂ්ඨ ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත්, ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවලදී විශිෂ්ඨත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයැඳුම්කරුවෙකුගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුවද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

* පොලිස් කොත්තාපල් රියදුරු තනතුරු

(ඈ) වෘත්තීය සුදුසුකම් :

(1) සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම,

(2) ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් ඇවුරුදු 01ක මෝටර් රථ පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

*සටහන.*—මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අලුත්වැඩියාව පිළිබඳ පළපුරුද්ද රිය පැදවීම දිගු කාලීන පළපුරුද්ද සඳහා ප්‍රමුඛත්වයක් දෙනු ලැබේ.

රිය පැදවීමේ දක්ෂතාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංගවිකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙළෙන කිසියම් අපේක්ෂකයෙකු වෙතොත් එම අපේක්ෂකයා සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක් ලබා තිබුණත්, ඔහු නුසුදුස්සෙකු වනු ඇත.

මූලික සුදුසුකම් තිබෙන අයැඳුම්කරුවන් වාහන පැදවීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ග නීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අපේක්ෂකයන් ලබා ඇති දැනුමත්, එක් එක් අපේක්ෂකයා පැදවීමට නිපුණත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමක් පරීක්ෂා කරනු ලැබේ.

(ඉ) දෘෂ්ඨිය පිළිබඳ අවශ්‍යතාවයන් -

එක් ඇසක දෘෂ්ඨිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ඨිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එයද පිළිගනු ලැබේ.

වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂකයෙකු උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

*(ඊ)* අනෙක් සුදුසුකම් -

අයැදුම්කරු අවිවාහක විය යුතුය. (දික්කසාද වුවත්ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පොලිස් ආරක්ෂක සහායක නිලධාරීන්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. *බඳවා ගැනීමේ ක්‍රමය :*

අයැදුම්පත් අනුව සුදුසුකම් ලබන අයැදුම්කරුවන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයැදුම්කරුවන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* ආධුනික පොලිස් කොස්තාපල් තනතුර

(1) මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

* ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර

(1) මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයැදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණය සඳහා කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40%ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා පොලිස් කොස්තාපල් අයැදුම්කරුවන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන පොලිස් කොස්තාපල් රියදුරු අයැදුම්කරුවන් වෘත්තීමය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

ලිඛිත පරීක්ෂණය - (පොලිස් කොස්තාපල් තනතුර)

ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

* වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය කාලය විනාඩි 45යි. වචන 500කට නොඅඩු විය යුතුයි.

* සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය කාලය පැය 01 යි.

06. *වෘත්තීමය පරීක්ෂණය - (පොලිස් කොස්තාපල් රියදුරු තනතුර)*

6.1 වෘත්තීමය පරීක්ෂණය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ පොලිස් රියදුරු පාසැලේ සහකාර අධ්‍යක්ෂ විසිනි.

6.2 වෘත්තීමය පරීක්ෂණය සඳහා ලකුණු 100ක් වෙන් කර ඇත. මෙම වෘත්තීමය පරීක්ෂණය පහත පරිදි සමන්විත වේ.

| | | |
|---|---|---|
| *(අ)* | රිය පැදවීමේ ප්‍රවීනත්වය | ලකුණු 50 |
| *(ආ)* | මාර්ග නීති උපදේශන සංග්‍රහය | ලකුණු 25 |
| *(ඇ)* | වාහන නඩත්තු කිරීම හා සුළු අලුත්වැඩියාවන් පිළිබඳ දැනුම | ලකුණු 25 |

6.3 වෘත්තීමය පරීක්ෂණය, රිය පැදවීමේ ප්‍රවීනත්වය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 50න් අවම වශයෙන් ලකුණු 25ක් හා මාර්ග නීති උපදේශන සංග්‍රහය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් සහ වාහන නඩත්තු කිරීම හා සුලු අලුත් වැඩියාවන් සම්බන්ධ දැනුම සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් ද ලබාගෙන වෘත්තීමය පරීක්ෂණය සඳහා වෙන් කර ඇති මුලු ලකුණු 100න් ලකුණු 50ක් අවම වශයෙන් ලබාගෙන ඇති අයැදුම්කරුවන් වෘත්තීමය පරීක්ෂණය සමත් වූ ලෙස සලකනු ලැබේ. වෘත්තීමය පරීක්ෂණයෙන් සමත්වන අයැදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

*සටහන.*-බඳවා ගනු ලබන පොලිස් කොස්තාපල් රියදුරන් පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම බර වාහන පැදවීමේ ප්‍රවීනතා සහතිකය ලබාගෙන පොලිස් විද්‍යාලය මඟින් පවත්වනු ලබන බර වාහන පැදවීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

07. *වෛද්‍ය පරීක්ෂණය :*

* ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලබන අයැදුම්කරුවන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. *පසුබිම් පරීක්ෂණය :*

*(අ)* අයැදුම්කරුගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඔහුගේ සමීප ඥාතීන්ගේද, ඔහු ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයැදුම්කරුවන් බඳවා ගනු නොලැබේ.

*(ආ)* බඳවා ගැනීමේදී අයැදුම්කරුවන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

09. *රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :*

* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරීන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබා ගත යුතුය.

* 2007.07.01 දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරීන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන ද්විතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* පත්වීමේ දින සිට වසර 05ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවණතාව ලබා නොගන්නා නිලධාරීන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. *පත්වීමේ කොන්දේසි -*

* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

11. *සේවා කොන්දේසි :*

*(අ)* පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

*(ආ)* තෝරාගනු ලබන අයැදුම්කරුවන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

*(ඇ)* ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙළුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතුය.

*(ඈ)* (i) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන්ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ii) තනතුර ස්ථිර කිරීමට පෙර පොලිස් කොස්තාපල් රියදුරන් ඉහත ඡේද (අ) 1 ට අමතරව බර වාහන පැදවීම සම්බන්ධයෙන් පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

*(ඉ)* පත්කර ගනු ලැබූ නිලධාරීන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුවද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් *ගැසට්* II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

*(ඊ)* අයැදුම්කරුවන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර, මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ පුහුණුව සඳහා නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය බාර දෙන අවස්ථාවේදීම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම බාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි, ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04ට අනුකූල විය යුතුය.

*(උ)* ආධුනික පොලිස් කොස්තාපල් හා ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් (විශේෂ කාර්ය බලකාය ) පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

*(ඌ)* ආධුනික පොලිස් කොස්තාපල් හා ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් (විශේෂ කාර්ය බලකාය ) පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

*(එ)* ආධුනික පොලිස් කොස්තාපල් හා ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් (විශේෂ කාර්ය බලකාය ) පොලිස් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12. *(අ)* මෙම *ගැසට් පත්‍රයේ* I කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

*(ආ)* 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

13. අයැදුම්කරුවන් පහත දැක්වෙන ලිපිලේඛනවල පිටපත් ස්වකීය අයැදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය).

*(අ)* උප්පැන්න සහතිකය;

*(ආ)* චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන);

*(ඇ)* අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික;

*(ඈ)* විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික;

*(ඉ)* සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්);

*(ඊ)* ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

14. *(අ)* දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් ඔවුන්ගේ අයැදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතුය.

*(ආ)* අයැදුම්කරු විසින් අයැදුම්පත් අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබ අදාළ සහතික පිටපත් සමඟ ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයැදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයැදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

*සටහන -* පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයැදුම්කරුවන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ජයන්ත වික්‍රමරත්න,
පොලිස්පති.

**පොලිස් දෙපාර්තමේන්තුව**

***විශේෂ කාර්ය බලකායේ ආධුනික පොලිස් කොස්තාපල් හා පොලිස් කොස්තාපල් රියදුරු තනතුර***

ආදර්ශ අයැදුම්පත්‍රය

01. *(අ)* සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය. :————.

*(ආ)* නම (මුලකුරු සමඟ) :————.

*(ඇ)* අයැදුම්කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————. (ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :———.

04. අයදුම්කරු උපන් ස්ථානය :———.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :———.පළාත

05. (අ) වර්තමාන ලිපිනය :———.

(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :———.

(ඇ) ස්ථිර ලිපිනය :———.

(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය :———.

06. (අ) ජාතිය :———.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වුයේ පරම්පරාවෙන්ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න)

(ඇ) ඔබ පුරවැසියෙකු වුයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :———.

* අයැදුම්කරු :———.
* අයැදුම්කරුගේ පියා :———.
* අයැදුම්කරුගේ පිය පක්ෂයේ මුත්තා :———.
* අයැදුම්කරුගේ පිය පක්ෂයේ මී මුත්තා :———.

07. උපන් දිනය (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි) වයස (ගැසට් නිවේදනය අනුව අයැදුම්පත් ඉදිරිපත් කරන දිනට)

අවුරුදු :———, මාස :———, දින :———.

08. උස ඃ අඩි :———, අඟල් :———, පපුව අඟල් :———.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයෙන් සඳහන් කර සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

10. අතිරේක සුදුසුකම් :———. (සහතික පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය).

11. විවාහක/අවිවාහක බව :———.

12. (අ) දැනට කරන රැකියාව :———.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක්ද ? :———.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේද ? :———.

14. අයැදුම්කරු ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්

(අ) ———,

(ආ) ———.

15. (අ) ඔබ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේද? :———.

(එසේ නම් ඒ පිළිබඳ විස්තර සඳහන් කරන්න)

(ආ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ සේවය කර තිබේද ? :———.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න.

16 (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේද? එසේ නම් අයැදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද? එසේ නම් අයැදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :———.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :———.

18. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේද? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත්ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :———.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද? එසේ නම් විස්තර සඳහන් කරන්න.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

———.
අයදුම්කරුගේ අත්සන.

දිනය :———.

12-750

---

## ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුව

### පොලිස් කොස්තාපල්, කාන්තා පොලිස් කොස්තාපල් හා පොලිස් කොස්තාපල් රියදුරු තනතුර

ශ්‍රී ලංකා පොලිස් දෙපාර්තමේන්තුවේ ආධුනික පොලිස් කොස්තාපල්, කාන්තා පොලිස් කොස්තාපල් හා පොලිස් කොස්තාපල් රියදුරු තනතුර සඳහා ශ්‍රී ලංකා පුරවැසියන්ගෙන් අයැදුම්පත් කැඳවනු ලැබේ.

02. පහත දක්වනු ලබන ආකෘති පත්‍රය අනුව සකස් කරන ලද අයැදුම්පත් අධ්‍යක්ෂ, බඳවා ගැනීම්. ආධුනිකයින් බඳවා ගන්නා කාර්යාලය, පළමු මහල, නො. 375, මයා මාවත , කොළඹ 06 යන ලිපිනයට එවිය යුතුය. අයැදුම්පත් බහා එවනු ලබන කවරයේ වම් කෙළවරේ උඩින් තමා අයැදුම්කරන තනතුර සඳහන් කර එය ලියාපදිංචි තැපෑලෙන් 2009.03.31 දිනට හෝ ඊට පෙර ඉහත සඳහන් ලිපිනයට අයැදුම්පත් ලැබීමට සැලැස්විය යුතුය. ප්‍රමාද වී ලැබෙන අයැදුම්පත් සම්බන්ධයෙන් ක්‍රියා නොකරනු ලබන අතර පොලිස් දෙපාර්තමේන්තුව විසින් අයැදුම්පත් නිකුත් කරනු නොලැබේ.

03. වැටුප් ක්‍රමය :

* *ආධුනික පොලිස් කොස්තාපල් තනතුර :*

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2160 - 17 x 2,880 - රු. 2, 54,100

** ආධුනික පොලිස් කාන්තා කොස්තාපල් තනතුර :*

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2160 - 17 x 2,880 - රු. 2, 54,100

** ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර :*

රු. 1,71,360 - 7 x 1,740 - 10 x 2160 - 17 x 2,880 - රු. 2, 54,100

ඉහත සඳහන් වැටුප් පරිමාණයට අමතරව මෙහි පහත සඳහන් දීමනා ඔවුන් වෙත මාසිකව හිමිවනු ලැබේ.

(අ) විශේෂ දුෂ්කර දීමනා -

1. මෙහෙයුම් කලාපවල සේවය සඳහා රු. 1,200
2. මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා රු. 600

(ආ) සංයුක්ත දීමනා -

1. මෙහෙයුම් කලාපවල සේවය සඳහා රු. 10,500
2. මෙහෙයුම් නොවන කලාපවල සේවය සඳහා රු. 3,500

*(අ)* නොමිලේ ගමන් පහසුකම්.

*(ආ)* නිලධාරීන්ට නොමිලේ වෛද්‍ය පහසුකම් (විදේශ රටකදී වුවද ප්‍රතිකාර කිරීමට මුදලින් ආධාර ලබා ගත හැක)

*(ඇ)* සියලුම නිල ඇඳුම් නොමිලේ සපයනු ලැබේ.

*(ඈ)* තමාගේ ක්‍රීඩා කෞශල්‍ය හා සහජ හැකියාවන් දියුණු කර ගැනීමේ පහසුකම්.

*(ඉ)* රාජකාරි සඳහා ගමන් වියදම්, දුෂ්කර සේවය හා විශිෂ්ට රාජකාරී සඳහා තෑගි වශයෙන් මුදල් ප්‍රදානය කරනු ලැබේ.

04. අවශ්‍ය මූලික සුදුසුකම් :

(අ) වයස් සීමාව -

* *ආධුනික පොලිස් කොස්තාපල් තනතුර*

*ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 - 28 ත් අතර විය යුතුය. එසේ වුවද දැනට පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරියේ නියුතු ආරක්ෂක සහායක නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

** ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර :*

*ගැසට් නිවේදනය* අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 18 - 26 ත් අතර විය යුතුය.

* ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර :

ගැසට් නිවේදනය අනුව අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 19 - 28 ත් අතර විය යුතුය. එසේ වුවද දැනට පොලිස් දෙපාර්තමේන්තුවේ රාජකාරියේ නියුතු ආරක්ෂක සහායක නිලධාරීන්ට අයදුම්පත් භාර ගන්නා අවසන් දිනට වයස අවුරුදු 30 දක්වා අයදුම්කළ හැක.

*(ආ)* අධ්‍යාපන සුදුසුකම් -

** ආධුනික පොලිස් කොස්තාපල් තනතුර :*

* අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී එකවර විෂයයන් 05කින් සමත් විය යුතුය.

** ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර :*

* අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරියේ දී එකවර විෂයයන් 05කින් සමත් විය යුතුය.

** ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර :*

* අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් ගණිතය හා මාධ්‍ය භාෂාව ඇතුළුව දෙවරකට නොවැඩි වාර ගණනකදී විෂයයන් 06ක් සමත් විය යුතුය. වාර දෙකකදී සාමාර්ථය ලබන අපේක්ෂකයෙකු ප්‍රථම වාරයේ දී එකවර විෂයයන් 05කින් සමත් විය යුතුය.

*සටහන 01.*—ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විෂය වර්ගීකරණය අනුව විෂයය අංක 41, 44 දරන විද්‍යා විෂයය යුගලය එක් විෂයයක් ලෙසද, අංක 42 සහ 45 දරන ගණිතය විෂය යුගලය එක් විෂයයක් වශයෙන්ද සලකා විභාගයෙන් සමත් විෂයය සංඛ්‍යාව තීරණය කරනු ලැබේ.

*සටහන 02.*—අ. පො. ස. (සා. පෙළ) විභාගයේ තාක්ෂණ විෂයය ලිඛිත පරීක්ෂණයෙන් අසමත්වීම එම විෂයයේ ප්‍රායෝගික පරීක්ෂණය සමත් වුවද එම විෂය අසමත් ලෙස සලකනු ලැබේ.

*සටහන 03.*—වෛකල්පිත දෙමළ, ඉංග්‍රීසි සහ සිංහල විෂයය අ. පො. ස. (සා. පෙළ) විෂයය ධාරාවට ඇතුළත් නොවන හෙයින් එම විෂයයන් සමත්වීම අ. පො. ස. (සා. පෙළ) විභාගයෙන් සමත් විෂයයක් ලෙස ගණනය කරනු නොලැබේ.

(ඇ) ශාරීරික සුදුසුකම්—

** ආධුනික පොලිස් කොස්තාපල් තනතුර :*

* උස අඩි 05 අඟල් 04 (අවම)
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා)

** ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර :*

* උස අඩි 05 අඟල් 02 (අවම)

** ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර :*

* උස අඩි 05 අඟල් 03 (අවම)
* පපුව අඟල් 30 (අවම/හුස්ම නාල්ලා)

*සටහන.*— විශිෂ්ට ක්‍රීඩා කෞශල්‍යයකින් යුක්තවූත්, ජාතික ක්‍රීඩා සංචිතයක සිට ජාතික මට්ටමේ ක්‍රීඩාවලදී විශිෂ්ටත්වයක් දක්වා ඇති හෝ ජාත්‍යන්තර තරගයකට සහභාගි වී ශ්‍රී ලංකාවට කීර්තියක් අත්කර දුන් අයදුම්කරුවෙකුගේ /අයදුම්කාරියකගේ ශාරීරික සුදුසුකම් මඳක් අඩු වුවද අනෙක් සුදුසුකම් සපුරා ඇතිනම් පොලිස්පතිගේ අභිමතය පරිදි බඳවා ගැනීම සඳහා සුදුසුකම් ලබයි.

** පොලිස් කොස්තාපල් රියදුරු තනතුර*

(ඈ) වෘත්තීය සුදුසුකම් :

(1) සැහැල්ලු මෝටර් රථ හෝ බර වාහන පැදවීමේ ප්‍රවීණතා සහතිකය ලබා තිබීම,

(2) ඉහත බලපත්‍රය ලබා ගැනීමෙන් පසුව අවම වශයෙන් ඇවුරුදු 01ක මෝටර් රථ පැදවීමේ පළපුරුද්දක් තිබිය යුතුය.

සටහන. මෝටර් රථ කාර්මික ශිල්පය පිළිබඳ දැනීම, මෝටර් රථ අලුත්වැඩියා පිළිබඳ පළපුරුද්ද රිය පැදවීම දිගු කාලීන පළපුරුද්ද සඳහා ප්‍රමුඛතාවයක් දෙනු ලැබේ.

* රිය පැදවීමේ දක්ෂතාව පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වන ශාරීරික අවයවයන් හැසිරවීමට බාධා ඇති කරන යම්කිසි අංගවිකලත්වයකින් හෝ වෙනත් ශාරීරික ආබාධයකින් පෙළෙන කිසියම් අපේක්ෂකයෙකු වෙතොත් එම අපේක්ෂකයා සේවයට සුදුසු බවට වෛද්‍ය සහතිකයක ලබා තිබුණත්, ඔහු නුසුදුස්සෙකු වනු ඇත.

* මූලික සුදුසුකම් තිබෙන අයදුම්කරුවන් වාහන පැදවීම හා නඩත්තු කිරීමේ හැකියාව පිළිබඳ පරීක්ෂා කරනු ලැබේ. එමෙන්ම මාර්ගනීති, රථ වාහන සංඥා ක්‍රම පිළිබඳ අපේක්ෂකයන් ලබා ඇති දැනුමත්, එක් එක් අපේක්ෂකයා පැදවීමට නිපුණත්වය ලබා ඇති වාහනයෙහි යාන්ත්‍රික සිද්ධාන්තයන් පිළිබඳ මූලික දැනුමක් පරීක්ෂා කරනු ලැබේ.

(ඇ) දෘෂ්ටිය පිළිබඳ අවශ්‍යතාවයන් -

එක් ඇසක දෘෂ්ටිය 6/12 අඩු නොවිය යුතුය. දෘෂ්ටිය එක් ඇසක 6/6 සහ අනෙක් ඇසෙහි 6/18 වේ නම් එයද පිළිගනු ලැබේ. වර්ණ දෘෂ්ටිය සාමාන්‍ය විය යුතුය. යම් අපේක්ෂකයෙකු/අපේක්ෂිකාවක් උපැස් යුවලක් හෝ ස්පර්ශ කාච පාවිච්චි කරන්නේ නම් ඔවුන් සේවයට නුසුදුසු වේ.

(ඉ) අනෙක් සුදුසුකම් -

* අයැදුම්කරු /අයදුම්කාරිය අවිවාහක විය යුතුය. (දික්කසාද වූවන්ද මේ සඳහා විවාහකයින් ලෙස සැලකේ) අනෙකුත් සුදුසුකම් සම්පූර්ණ කර තිබෙන දැනටමත් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කරන පොලිස් ආරක්ෂක සහායක නිලධාරින්ට මෙම කොන්දේසිය පමණක් අදාළ නොවේ.

05. බඳවා ගැනීමේ ක්‍රමය :

* අයැදුම්පත් අනුව සුදුසුකම් ලබන අයැදුම්කරුවන්/ අයදුම්කාරියන් සඳහා පොලිස් දෙපාර්තමේන්තුව විසින් පවත්වනු ලබන මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය. මූලික සුදුසුකම් පරීක්ෂා කිරීමේ පරීක්ෂණයෙන් සමත් වන අයැදුම්කරුවන්/අයදුම්කාරියන් පමණක් පහත සඳහන් ශාරීරික යෝග්‍යතා පරීක්ෂණය හෙවත් ඔරොත්තු දීමේ පරීක්ෂණය, එනම් දරා ගැනීමේ ශක්තිය උරගා බැලීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* *ආධුනික පොලිස් කොස්තාපල් තනතුර*

මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

* *ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් තනතුර*

මීටර් 1000 - මිනිත්තු 05 තත්පර 14

* *ආධුනික පොලිස් කොස්තාපල් රියදුරු තනතුර*

මීටර් 1000 - මිනිත්තු 03 තත්පර 44

* යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත් වන අයදුම්කරුවන්/ අයදුම්කාරියන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ. අවසන් සම්මුඛ පරීක්ෂණයෙන් ලකුණු 40% ක් හෝ ඊට වඩා ලකුණු ලබා ගන්නා පොලිස් කොස්තාපල් අයදුම්කරුවන් හා කාන්තා පොලිස් කොස්තාපල් අයදුම්කාරියන් පමණක් ලිඛිත පරීක්ෂණයට කැඳවනු ලැබේ. යෝග්‍යතා පරීක්ෂණයෙන් සමත්වන පොලිස් කොස්තාපල් රියදුරු අයදුම්කරුවන් වෘත්තීමය පරීක්ෂණයට කැඳවනු ලැබේ.

* ලිඛිත පරීක්ෂණය :

(පොලිස් කොස්තාපල්/ කාන්තා පොලිස් කොස්තාපල් තනතුර)

* ලිඛිත පරීක්ෂණය ප්‍රශ්න පත්‍ර දෙකකින් සමන්විත වේ. එනම්,

* වාක්‍ය රචනය ප්‍රශ්න පත්‍රය.—කාලය විනාඩි 45 යි. වචන 500 කට නොඅඩු විය යුතුය.

* සාමාන්‍ය දැනීම හා බුද්ධි පරීක්ෂණය ප්‍රශ්න පත්‍රය.—කාලය පැය 01 යි.

06. වෘත්තීමය පරීක්ෂණය - ( පොලිස් කොසතාපල් රියදුරු තනතුර)

6.1 වෘත්තීමය පරීක්ෂණය පවත්වනු ලබන්නේ ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂකගේ අධීක්ෂණය යටතේ පොලිස් රියදුරු පාසැලේ සහකාර අධ්‍යක්ෂ විසිනි.

6.2 වෘත්තීමය පරීක්ෂණය සඳහා ලකුණු 100 ක් වෙන් කර ඇත. මෙම වෘත්තීමය පරීක්ෂණය පහත පරිදි සමන්විත වේ.

| | |
|---|---|
| (අ) රිය පැදවීමේ ප්‍රවීනත්වය | ලකුණු 50 |
| (ආ) මාර්ග නීති උපදේශන සංග්‍රහය | ලකුණු 25 |
| (ඇ) වාහන නඩත්තු කිරීම හා සුළු අලුත්වැඩියාවන් පිළිබඳ දැනුම | ලකුණු 25 |

6.3 වෘත්තීමය පරීක්ෂණය, රිය පැදවීමේ ප්‍රවීනත්වය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 50න් අවම වශයෙන් ලකුණු 25 ක් හා මාර්ග නීති උපදේශන සංග්‍රහය සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් සහ වාහන නඩත්තු කිරීම හා සුළු අලුත්වැඩියාවන් සම්බන්ධ දැනුම සඳහා වෙන් කර ඇති උපරිම ලකුණු 25න් අවම වශයෙන් ලකුණු 12.5ක් ද ලබාගෙන වෘත්තිය පරීක්ෂණය සඳහා වෙන් කර ඇති මුළු ලකුණු 100 න් ලකුණු 50ක් අවම වශයෙන් ලබාගෙන ඇති අයදුම්කරුවන් වෘත්තීමය පරීක්ෂණය සමත් වූ ලෙස සලකණු ලැබේ.

වෘත්තීමය පරීක්ෂණයෙන් සමත්වන අයදුම්කරුවන් පමණක් අවසන් සම්මුඛ පරීක්ෂණයට කැඳවනු ලැබේ.

සටහන :

බඳවා ගනු ලබන පොලිස් කොසතාපල් රියදුරන් පරිවාස කාලය අවසන් වීමට ප්‍රථම බර වාහන පැදවීමේ ප්‍රවීනතා සහතිකය ලබාගෙන පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන බරවාහන පැදවීමේ පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

07. වෛද්‍ය පරීක්ෂණය :

* ප්‍රමුඛතා හා කුසලතා ලැයිස්තුව අනුව තෝරා ගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් ස්වකීය පත්වීමට පෙර වෛද්‍ය පරීක්ෂණයකින් සමත් විය යුතුය. වෛද්‍ය පරීක්ෂණයෙන් අසමත් වූවන් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

08. පසුබිම් පරීක්ෂණය :

(අ) අයැදුම්කරුගේ/අයදුම්කාරියගේ යහපත් චරිතය තහවුරු කර ගැනීම සඳහා ඔහු හා ඇය ඔහුගේ/ඇයගේ සමීප ඥාතීන්ගේ ද, ඔහු ඇසුරු කරන්නන්ගේ යහපත් චරිතය හා හැසිරීම සම්බන්ධව පරීක්ෂණ පවත්වනු ලබන අතර, අයහපත් පසුබිම් වාර්තා සහිත අයැදුම්කරුවන්/අයදුම්කාරියන් බඳවා ගනු නොලැබේ.

(ආ) බඳවා ගැනීමේදී අයැදුම්කරුවන්/අයදුම්කාරියන් විසින් අසත්‍ය තොරතුරු සැපයීම ඔහු /ඇය බඳවා ගැනීමට නුසුදුසුකමක් වේ. අසත්‍ය තොරතුරු සැපයූ බව බඳවා ගැනීමෙන් පසුව හෙළි වුවහොත් සේවයෙන් ඉවත් කරනු ලැබේ.

09. රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම :

* රාජ්‍ය පරිපාලන හා ස්වදේශ කටයුතු අමාත්‍යාංශය විසින්, 2007.04.28 දින නිකුත් කර ඇති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 07/2007 අනුව 2007.07.01 දින සිට රාජ්‍ය සේවයට/පළාත් රාජ්‍ය සේවයට බඳවා ගනු ලබන සියලුම නිලධාරින්/නිලධාරිනියන් සේවයට බැඳුණු රාජ්‍ය භාෂාවට අතිරේක වශයෙන් අනෙක් රාජ්‍ය භාෂාව පිළිබඳව ප්‍රවීණතාවක් සේවයට බැඳී වසර 05ක් තුළ ලබා ගත යුතුය.

* 2007.07.01 දින සිට ශ්‍රී ලංකා පොලිස් සේවයට බඳවා ගනු ලබන සහකාර පොලිස් අධිකාරී තනතුරට පහළ තනතුරු දරන නිලධාරින්/නිලධාරිනියන් රාජ්‍ය භාෂා දෙපාර්තමේන්තුව විසින් පවත්වන ද්වීතීයික කුසලතා මට්ටමේ භාෂා පාඨමාලා පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

* පත්වීමේ දින සිට වසර 05ක් තුළ නියමිත දෙවන භාෂා ප්‍රවීණතාව ලබා නොගන්නා නිලධාරින්ගේ/නිලධාරිනියන්ගේ වැටුප් වර්ධක සුදුසුකම් ලබා ගන්නා තෙක් විලම්භනය කරනු ඇත.

10. පත්වීමේ කොන්දේසි :

* මෙම පත්වීම ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. වැන්දඹු/වැන්දඹු පුරුෂ අනත්දරු විශ්‍රාම වැටුප් ක්‍රමයට දායක මුදල් ගෙවිය යුතුය.

11. සේවා කොන්දේසි :

(අ) පත්වීම තුන් අවුරුදු ආධුනික කාල පරිච්ඡේදයකට යටත් වනු ඇත.

(ආ) තෝරාගනු ලබන අයදුම්කරුවන්/අයදුම්කාරියන් රාජ්‍ය භාෂා ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා ද, දැනටමත් සම්පාදිතව පවත්නා හෝ මින් මතු සම්පාදනය කරනු ලබන කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද අනුකූලව කටයුතු කළ යුතුය.

(ඇ) ඔවුහු ආයතන සංග්‍රහයේ පළමුවැනි සහ දෙවැනි වෙලුමේ අඩංගු නියෝගයන්ට ද මුදල් රෙගුලාසි, දෙපාර්තමේන්තු නියෝග සහ පොලිස්පතිවරයා විසින් හෝ රජය විසින් හෝ කලින් කලට නිකුත් කරනු ලබන වෙනත් කිසියම් නියෝගයක් වෙතොත් ඒවාට ද යටත් විය යුතුය.

(ඈ) (i) තනතුර ස්ථිර කිරීමට පෙර සෑම නිලධාරියෙකුම/නිලධාරිනියෙකුම නියමිත දෙපාර්තමේන්තු පරීක්ෂණ වලින් සමත් විය යුතු වේ. නියමිත පරීක්ෂණයන්ගෙන් සමත්වීමට අපොහොසත් වන්නවුන් හෝ පොලිස් රාජකාරි කටයුතු සඳහා නුසුදුසු යැයි නිගමනය කරනු ලබන අයවලුන්ද සේවයෙන් ඉවත් කිරීමට ඉඩ ඇත.

(ii) තනතුර ස්ථිර කිරීමට පෙර පොලිස් කොස්තාපල් රියදුරන් ඉහත ඡේද (අ) 1 ට අමතරව බර වාහන පැදවීම සම්බන්ධයෙන් පොලිස් විද්‍යාලය මගින් පවත්වනු ලබන පරීක්ෂණයෙන් සමත් විය යුතුය.

(ඉ) පත්කර ගනු ලැබූ නිලධාරින්/නිලධාරිනියන් පොලිස්පතිගේ විශේෂ අවසරය නොමැතිව ඔවුන්ගේ තනතුරෙහි ස්ථිර වනතුරු විවාහ වීමට අවසර දෙනු නොලැබේ. එසේ වුවද 1973 පෙබරවාරි මස 28 දාතමින් පොලිස් ගැසට් II අංක 41 දරන නිවේදනය අනුව හා 2006.10.19 දින පොලිස්පති චක්‍රලේඛ අංක 1952/2006 අනුව හා 2007.08.09 දින එම චක්‍රලේඛයේ සංශෝධනය අනුව විශේෂ හේතූන් මත පොලිස්පතිගේ අවසරය ඇතිව විවාහ වීමට හැකියාව ඇත.

(ඊ) අයැදුම්කරුවන් / අයදුම්කාරියන් පත්කර ගනු ලැබ පුහුණුවෙන් පසු අවුරුදු 03ක පරිවාස සේවා කාලයක් පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය කළ යුතු වන අතර, මෙම පරිවාස සේවා කාලය අවසන් වීමට පෙර ඔවුන් ඉල්ලා අස්වීමට කැමැත්තේ නම් ඔහුගේ/ඇයගේ පුහුණුව සඳහා, නිල ඇඳුම් ආදිය සම්බන්ධයෙන් දරන්නට සිදු වූ අනෙකුත් වියදම් ඉල්ලා අස්වීමේ ලිපිය බාර දෙන අවස්ථාවේදී ම නියම කරන ලද මුදලක් ගෙවීමට කැමැත්ත පළ කිරීමේ ගිවිසුමක් ඔවුන් විසින් අත්සන් කළ යුතුය. මෙම ගෙවීම ශ්‍රී ලංකා පොලිස් විද්‍යාලයේ අධ්‍යක්ෂ විසින් ගණන් බලා තීරණය කරනු ඇත. ඉල්ලා අස්වීම බාර ගැනීම සම්බන්ධයෙන් 1985 හි 1 වැනි වෙලුමෙහි, ආයතන සංග්‍රහයේ 5 වැනි පරිච්ඡේදයේ වගන්ති 04ට අනුකූල විය යුතුය.

(උ) ආධුනික පොලිස් කොස්තාපල් හා ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් හා ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1693/2003 අනුව පොලිස් ආචාර ධර්ම සංග්‍රහයට අනුකූලව ක්‍රියා කරන බවට ප්‍රතිඥා/දිවුරුම් දිය යුතුය.

(ඌ) ආධුනික පොලිස් කොස්තාපල්, ආධුනික කාන්තා පොලිස් කොස්තාපල්, /ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් පුහුණුව ආරම්භ කළ වහාම පොලිස්පති චක්‍රලේඛ 1804/2004 අනුව අභිමානවත් රාජ්‍ය සේවයකට කැපවීමේ ස්වයං ප්‍රතිඥාව දිය යුතුය.

(එ) ආධුනික පොලිස් කොස්තාපල්, ආධුනික කාන්තා පොලිස් කොස්තාපල් /ආධුනික පොලිස් කොස්තාපල් රියදුරුවරුන් දෙපාර්තමේන්තුවේ අනුමත උසස් කිරීමේ පරිපාටිවලට අනුකූලව උසස් කිරීම සඳහා අවකාශ තිබේ.

12 (අ) මෙම ගැසට් පත්‍රයේ I කොටස (IIඅ) වැනි ඡේදයේ ආරම්භයේ පළකරන ලද රාජ්‍ය සේවා තනතුරුවලට පත්කිරීම් සම්බන්ධයෙන් අදාළ වන පොදු කොන්දේසි බලපානු ඇත.

(ආ) 1990.03.10 වැනි දින අංක 15/90 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය පරිදි බඳවා ගැනීම් සිදු කරනු ලැබේ.

13. අයැදුම්කරුවන්/ අයදුම්කාරියන් පහත දැක්වෙන ලිපිලේඛනවල පිටපත් ස්වකීය අයදුම්පත්‍රවලට අමුණා එවිය යුතුය. (මුල් ලිපි ඉදිරිපත් නොකළ යුතුය).

(අ) උප්පැන්න සහතිකය,

(ආ) චරිතය පිළිබඳව මෑතකදී ලබාගත් සහතික දෙකක් (ඥාතීන් නොවන),

(ඇ) අධ්‍යාපන සුදුසුකම් සනාථ කිරීම සඳහා වූ සහතික,

(ඇ) විශේෂ වාර්තා සහිත ක්‍රීඩා පිළිබඳ සහතික හෝ විෂය බාහිර කටයුතු සම්බන්ධයෙන් ලබාගත් සහතික,

(ඉ) සේවා පළපුරුද්ද සම්බන්ධ සහතික (තිබේ නම් පමණක්),

(ඊ) ජාතික හැඳුනුම්පතෙහි ඡායා පිටපතක්.

14 (අ) දැනටමත් රාජ්‍ය සේවයෙහි නියුතුව සිටින අයදුම්කරුවන් / අයදුම්කාරියන් ඔවුන්ගේ අයදුම්පත අදාළ දෙපාර්තමේන්තු ප්‍රධානීන් මඟින් ඉදිරිපත් කළ යුතුය. අයදුම්කරු තෝරා ගන්නා ලද්දේ නම් ඔහු/ඇය නිදහස් කළ හැකි බවට සහතිකයක් යා කළ යුතුය.

(ආ) අයැදුම්කරු/අයදුම්කාරියන් විසින් අයදුම්පත් අඟල් 11 x 8 ප්‍රමාණයේ කඩදාසිවල ස්වකීය අත් අකුරුවලින්ම සම්පූර්ණ කරනු ලැබ අදාළ සහතික පිටපත් සමග ඉහත දෙවන ඡේදයේ දක්වා ඇති ලිපිනයට ලැබෙන සේ එවිය යුතු අතර, කුමන හෝ හේතුවක් නිසාවත් එය කිසියම් නිලධාරියෙකු වෙත පෞද්ගලිකව බාර නොදිය යුතුය.

15. මෙම නිවේදනයෙහි දක්වා ඇති අවශ්‍යතාවයන් සෑම අයුරකින්ම සනාථ නොකරන අයදුම්පත් ප්‍රතික්ෂේප කෙරෙනු ඇත. එබඳු අයදුම්කරුවන්ට ඒ සම්බන්ධයෙන් පිළිතුරු එවනු නොලැබේ.

සටහන - පරීක්ෂණ හා සම්මුඛ පරීක්ෂණවලට කැඳවනු ලබන අයදුම්කරුවන්ට/අයදුම්කාරියන්ට ගමන් වියදම් හෝ අනෙකුත් වියදම් කිසිවක් ගෙවනු නොලැබේ.

ජයන්ත වික්‍රමරත්න,
පොලිස්පති.

**පොලිස් දෙපාර්තමේන්තුව**

***ආධුනික පොලිස් කොස්තාපල්, කාන්තා පොලිස් කොස්තාපල් හා පොලිස් කොස්තාපල් රියදුරු තනතුර***

ආදර්ශ අයදුම්පත්‍රය

01. (අ) සම්පූර්ණ නම (පැහැදිලි ලොකු අකුරෙන්) උප්පැන්න සහතිකයේ සඳහන් කර ඇති පරිදිම විය යුතුය. :————.

(ආ) නම (මුලකුරු සමඟ) :————.

(ඇ) අයදුම්කරන තනතුර :————.

02. ජාතික හැඳුනුම්පත් අංකය :————. (ජාතික හැඳුනුම්පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය.)

03. පියාගේ සම්පූර්ණ නම :————.

04. අයදුම්කරු/අයදුම්කාරිය උපන් ස්ථානය :————.

උපන් ස්ථානයට අදාළ පොලිස් ස්ථානය :————.පළාත :———.

05. (අ) වර්තමාන ලිපිනය :————.

(ආ) වර්තමාන ලිපිනයට අදාළ පොලිස් ස්ථානය :————.

(ඇ) ස්ථිර ලිපිනය :————.

(ඈ) ස්ථිර ලිපිනයට අදාළ පොලිස් ස්ථානය හා මැතිවරණ කොට්ඨාසය :————.

06. (අ) ජාතිය :————.

(ආ) ඔබ ශ්‍රී ලංකා පුරවැසියෙකු වුයේ පරම්පරාවෙන්ද ? නැතහොත් ලියාපදිංචි කිරීමෙන්ද (ලියාපදිංචි වීමෙන් නම් එම සහතිකයේ පිටපතක් අමුණන්න)

(ඇ) ඔබ පුරවැසියෙකු වුයේ පරම්පරාවෙන් නම් උපන් ස්ථානය :————.

* අයදුම්කරු/ අයදුම්කාරිය :————.
* අයදුම්කරුගේ / අයදුම්කාරියගේ පියා :————.
* අයදුම්කරුගේ / අයදුම්කාරියගේ පිය පක්ෂයේ මුත්තා :————.
* අයදුම්කරුගේ / අයදුම්කාරියගේ පිය පක්ෂයේ මී මුත්තා :————.

07. උපන් දිනය (උප්පැන්න සහතිකයේ ඡායා පිටපතක් ඇමිණිය යුතුයි) වයස (ගැසට් නිවේදනය අනුව අයැදුම්පත් ඉදිරිපත් කරන දිනට)

අවුරුදු :————, මාස :————, දින :————.

08. උස ፥ අඩි :————, අඟල් :————, පපුව ፥ අඟල් :————.

09. අධ්‍යාපන සුදුසුකම් : (සමත් වී ඇති විභාගයන් සඳහන් කර සහතිකවල පිටපත් ඇමිණිය යුතුය)

10. අතිරේක සුදුසුකම් :————. (සහතික පතේ ඡායා පිටපතක් ඇමිණිය යුතුය).

11. විවාහක/අවිවාහක බව :————.

12. (අ) දැනට කරන රැකියාව :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සාමාජිකයෙක්ද ? :————.

13. ඔබට විශේෂ දක්ෂතාවයන් සහ/හෝ සුදුසුකම් තිබේද ? :————.

14. අයදුම්කරු/අයදුම්කාරිය ගැන විමසුම් කළ හැකි දෙදෙනෙකුගේ නම් සහ ලිපිනයන්

(අ) ————,

(ආ) ————.

15. (අ) ඔබ නිත්‍ය පොලිස් සේවාවේ තනතුරක් සඳහා මීට පෙර ඉල්ලුම් කර තිබේද? :————.

(එසේ නම් ඒ පිළිබඳ සඳහන් කරන්න)

(ආ) ඔබ මීට පෙර නිත්‍ය පොලිස් සේවයේ සේවය කර තිබේද ? :————.

එසේ නම් ඔබ තනතුරින් ඉවත් වූ හේතු සඳහන් කරන්න.

16 (අ) ඔබ සන්නද්ධ සේවයක සේවය කරන්නේද? එසේ නම් අයදුම්පත අදාළ හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය :————.

(ආ) ඔබ සන්නද්ධ සේවාවක සේවය කර ඇත් ද ? එසේ නම් අස්වීමේ දී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

17. (අ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයට අනුයුක්තව සිටින්නේ ද? එසේ නම් අයදුම්පත හමුදා ප්‍රධානියාගේ මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතුය. :————.

(ආ) ඔබ සන්නද්ධ ස්වේච්ඡා සේවයෙහි අනුයුක්තව සිටියේ ද? එසේ නම් අස්වීමේදී දෙන සහතිකයේ ඡායා පිටපතක් අමුණන්න. :————.

18. ඔබ කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත් අඩංගුවට ගෙන තිබේද? එසේම අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ හෝ ඇත්ද ? (එසේ නම් විස්තර සඳහන් කරන්න) :————.

19. ඔබගේ කිසියම් ඥාතියෙකු අපරාධයක් සම්බන්ධයෙන් හෝ සැකපිට අත්අඩංගුවට ගෙන තිබේද? එසේ නම් කිසියම් අපරාධයක් සම්බන්ධයෙන් වරදකට චෝදනා ලැබ හෝ උසාවියකට කැඳවනු ලැබ හෝ දඬුවම් ලැබ ඇද්ද? එසේ නම් විස්තර සඳහන් කරන්න.

ඉහත කරුණු මාගේ දැනීමේ හා විශ්වාසයේ හැටියට සත්‍ය හා නිවැරදි ඒවා බවට මින් සහතික කරමි. එසේම ඉහත දැක්වූ තොරතුරු වැරදි හා අසත්‍ය ඒවා බවට හෙළිවුවහොත් මා සේවයට පත්කර ගෙන ඇතත් ඕනෑම අවස්ථාවක දී පොලිස් දෙපාර්තමේන්තුවේ සේවය වහාම නතර කිරීමට යටත් වන බව දනිමි.

―――――.
අයදුම්කරුගේ/අයදුම්කාරියගේ අත්සන.

දිනය :――――.

12-751

# විභාග, විභාග ප්‍රතිඵල ආදිය

**ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය**

## VI වන ශ්‍රේණියේ සමෘද්ධි කළමනාකරුවන් V වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය - 2008

1.0 ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ වසර 06ක සේවා කාලයක් ඇති vi වැනි ශ්‍රේණියේ සමෘද්ධි කළමනාකරුවන් v වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරග විභාගය, විභාග කොමසාරිස් ජනරාල් විසින් කොළඹ දී 2009 මාර්තු මස පවත්වනු ලැබේ.

2.0 විභාගය ප්‍රශ්න පත්‍ර 03කින් සමන්විත වේ.

2.1 බුද්ධි පරීක්ෂණ හා අවබෝධය :

විභාග අපේක්ෂකයින්ගේ අවබෝධ කර ගැනීමේ හැකියාව, තර්කානුකූල බුද්ධිය හා ක්ෂණිකව සිතීමේ හැකියාව පිළිබඳව සොයා බලන ප්‍රශ්න පත්‍රයක්.

* ලකුණු 100 යි.
* කාලය පැය 1 1/2 යි.
* සමත්වීම සඳහා ගතයුතු අවම ලකුණු 40%

2.2 සමෘද්ධි විෂයය පිළිබඳ දැනීම :

මේ සඳහා අදාළ ප්‍රශ්න පත්‍රය කොටස් කීපයකින් ( A, B, C, D හා E වශයෙන්) පැවැත්විය යුතු අතර ප්‍රශ්න පත්‍රයේ ඒ කොටස සෑම සමෘද්ධි කළමනාකරුවෙකුටම පොදුවේ පිළිතුරු සැපයිය හැකි සමෘද්ධි ව්‍යාපාරය හා ඊට ආශ්‍රිත පොදු කරුණු ආශ්‍රිතව සැකසුනු එකක් විය යුතුය.

ප්‍රශ්න පත්‍රයේ සෙසු කොටස් තෝරාගෙන පිළිතුරු සැපයිය යුතු ආකාරයේ එකක් විය යුතු අතර එම එක් එක් කොටස් බැංකු සංගම් කළමනාකරුවන්, මහා සංගම් කළමනාකරුවන්, ව්‍යාපෘති කළමනාකරුවන්, මුලස්ථාන කළමනාකරුවන්, දිස්ත්‍රික් ලේකම් කළමනාකරුවන් සහ ප්‍රධාන කාර්යාලීය කළමනාකරුවන් වෙනුවෙන් ඔවුන් ඉටු කරනු ලබන රාජකාරී ආශ්‍රිතව සැකසුනු එකක් විය යුතුය.

* ලකුණු 100 යි.
* කාලය පැය 1 1/2යි.
* සමත්වීම සඳහා ගතයුතු අවම ලකුණු 40%

2.3 මුදල් රෙගුලාසි, ආයතන සංග්‍රහය පිළිබඳ දැනීම හා සාමාන්‍ය දැනීමේ ප්‍රශ්න පත්‍රය :

මෙහිදී ආයතන සංග්‍රහය හා මුදල් රෙගුලාසිවල තෝරාගත් පරිච්ඡේදයක් හා කළමනාකරුවන්ගේ සාමාන්‍ය දැනීම මැන බලන ප්‍රශ්න පත්‍රයක්.

* ලකුණු 100 යි.
* කාලය පැය 1 1/2 යි
* සමත්වීම සඳහා ගතයුතු අවම ලකුණු 40%

3.0 මෙම පරීක්ෂණ සිංහල හා දෙමළ මාධ්‍යවලින් පමණක් පවත්වනු ලැබේ. පරීක්ෂණ සඳහා ඉල්ලුම් කිරීමේ ආදර්ශ අයදුම්පත්‍රයක් මෙම නිවේදනය අවසානයේ පළකර ඇත. එම ආදර්ශ අයදුම්පත්‍රය අනුව අපේක්ෂකයින් විසින් ස්වකීය අයදුම්පත්‍ර පිළියෙළ කරගත යුතුයි. අයදුම්පත්‍රය පිළියෙල කර ගත යුත්තේ ඒ 4 ප්‍රමාණයේ කඩදාසියක පමණි. අයදුම්පත්‍රය සම්පූර්ණ කළ යුත්තේ අපේක්ෂකයා විභාගයට ඉදිරිපත් වන භාෂා මාධ්‍යයෙන් ය. ඉල්ලුම්කරන මාධ්‍යය පසුව වෙනස් කිරීමට ඉඩදෙනු නොලැබේ. ඉල්ලුම්පත්‍රයේ ශීර්ෂ අංක 1.0 සිට 4.0 වන තෙක් පළමුවන පිටුවට ද ඉතිරිය දෙවන පිටුවට ද වන ලෙස ගෙන සකස් කළ යුතු බවත් ඊට අදාළ තොරතුරු තම අත් අකුරෙන්ම පැහැදිළිව ඇතුළත් කළ යුතුය. ආදර්ශ ඉල්ලුම්පත්‍රයට අනුකූල නොවන ඉල්ලුම්පත්‍රත්, අසම්පූර්ණ ලෙස තොරතුරු සඳහන් කර ඇති ඉල්ලුම්පත්‍රත් දැනුම් දීමකින් තොරව ප්‍රතික්ෂේප කරනු ලැබේ. අදාළ ඉල්ලුම්පත්‍රයේ ඡායා පිටපතක් ළඟ තබාගැනීම ප්‍රයෝජනවත් වනු ඇත. ඉල්ලුම්පත්‍රය පිළියෙළ කරගන්නා විට එහි ශීර්ෂය සඳහන් විභාගයේ නම සිංහල ඉල්ලුම්පත්‍රවල සිංහලට අමතරව ඉංග්‍රීසියෙන් ද, දෙමළ අයදුම්පත්‍රවල දෙමළට අමතරව ඉංග්‍රීසියෙන් ද යෙදිය යුතුය.

04. අයදුම්පත්‍රය තම ආයතන ප්‍රධානියා මඟින් (දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයකට අනුයුක්ත වන්නේ නම් එහි දිස්ත්‍රික් ලේකම්/ප්‍රාදේශීය ලේකම් මඟින් 2009 ජනවාරි 26 වැනි දිනට හෝ ඊට පෙර විභාග කොමසාරිස් ජනරාල්, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව, සංවිධාන හා විදේශ විභාග ශාඛාව, පැලවත්ත, බත්තරමුල්ල යන ලිපිනයට ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත්‍රය බහා එවන කවරයේ ඉහළ වම් කෙළවරේ අයදුම්කරන විභාගයේ නම සඳහන් කළ යුතුය. විභාගය සඳහා වූ අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පසුව ලැබෙන අයදුම්පත්‍ර ප්‍රතික්ෂේප කරනු ලැබේ. තම අයදුම්පත්‍රය රාජ්‍ය භාෂාවෙන් හෝ තමන් සේවයට බඳවා ගන්නා ලද භාෂා මාධ්‍යය අනුව පිළියෙළ කර ගත හැකිය.

05. යම් අපේක්ෂකයෙකුට විභාගයට යටත් පිරිසෙයින් දින හතකට කලින් තමාගේ ප්‍රවේශපත්‍රය නොලැබුනහොත්, ඔහු විසින් ඒ බව අප්‍රමාදව පහත දැක්වෙන තොරතුරු සමග බත්තරමුල්ල, පැලවත්ත, ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුවේ විභාග කොමසාරිස් ජනරාල්ට දැනුම්දිය යුතුය. විදුලි පණිවිඩ යවන ලිපිනය, “විභාග, බත්තරමුල්ල.” :

1. විභාගයේ නම :――――.
2. අයදුම්කරුගේ සම්පූර්ණ නම :――――.
3. අයදුම්කරුගේ ලිපිනය :――――.
4. ඉල්ලුම්පත්‍රය තැපැල් කළ තැපැල් කාර්යාලය :――――.

5. ලියාපදිංචි අංකය හා දිනය :———.

අයදුම්කරුවන් වෙත ප්‍රවේශ පත්‍ර නිකුත් කළ වහාම ඒ බව සඳහන් කරමින් පුවත්පත් නිවේදනයක් ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව මගින් පළ කරනු ඇත. නිවේදනය පළ වී දින 2ක් හෝ 3ක් ගතවූ පසුවත් ප්‍රවේශ පත්‍රය නොලැබුණි නම් දැන්වීමේ සඳහන් ආකාරයට ඒ බව ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දන්වා සිටිය යුතුයි.ඔබ වෙත තබාගත් අයදුම්පත්‍රයේ හා මුදල් ගෙවූ කුවිතාන්සියේ සහතික කළ ඡායා පිටපත් ද, ලියාපදිංචි කළ කුවිතාන්සිය ද, කොළඹින් බැහැර ප්‍රදේශයක නම් ප්‍රවේශ පත්‍රය එවීම සඳහා ෆැක්ස් අංකයක් ද සඳහන් ඔබගේ ඉල්ලීම් ලිපිය ද ළඟ තබාගෙන ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව වෙත දැන්වීම වඩාත් ඵලදායි වනු ඇත.

6.0 අපේක්ෂකයින් විභාග ශාලාව තුළ දී තමන් පෙනී සිටින සෑම විෂයයක් සඳහාම විභාග ශාලාධිපතිවරයා සෑහීමකට පත්වන පරිදි ස්වකීය අනන්‍යතාව සනාථ කළ යුතුය. ඒ සඳහා පහත සඳහන් ලියවිලි අතුරින් කුමක් වුවත් භාර ගැනේ :

1. පුද්ගලයින් ලියාපදිංචි කිරීමේ කොමසාරිස් විසින් නිකුත් කරන ලද වලංගු ජාතික හැඳුනුම්පත්‍රයක් :
2. වලංගු විදේශ ගමන් බලපත්‍රයක් (පාස්පෝට් බලපත්‍රයක්).

7.0 විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට විභාග අපේක්ෂකයින් යටත් වේ. එම නීතිරීති උල්ලංඝනය කළහොත් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන දඬුවමකට යටත් වීමට ඔහුට හේ ඇයට සිදුවනු ඇත.

8.0 මෙම විභාගයට පෙනී සිටීමට අයදුම්පත්‍ර එවා ඇති සියලු දෙනාට විභාග කොමසාරිස් ජනරාල් විසින් ප්‍රවේශපත්‍ර නිකුත් කරන අතර, ඔවුන්ට තමන්ගේ කාර්යාල ප්‍රධානීන් විසින් රාජකාරී නිවාඩු ලබාදිය යුතුය.

9.0 මෙම රෙගුලාසිවලට අඩංගු නොවූ යම් කරුණක් වෙතොත්, ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ගේ අභිමතය පරිදි ඒ ගැන ක්‍රියා කරනු ලැබේ.

ආර්. පී. බී. තිලකසිරි,
අධ්‍යක්ෂ ජනරාල්.

ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය,
04 වැනි මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

## VI වැනි ශ්‍රේණියේ සමෘද්ධි කළමනාකරුවන් V වැනි ශ්‍රේණියට උසස් කිරීම සඳහා වන තරඟ විභාගය - 2008

## Competitive Examination for Promotion of Grade VI Samurdhi Managers to Grade V- 2008

[ ]
කාර්යාලීය ප්‍රයෝජනය සඳහා

විභාගයට පෙනී සිටින භාෂා මාධ්‍යය : [ ]

සිංහල - 2 දෙමළ -3 (අදාළ අංකය කොටුව තුළ ලියන්න.)

1.0 නම :

1.1 මුලකුරු අගට යොදා මුලකුරු සමග නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
*උදා* :NIMAL, J. M. D.

1.2 සම්පූර්ණ නම :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)

1.3 සම්පූර්ණ නම :———.
(සිංහලෙන්/දෙමළෙන්)

2.0 රාජකාරි ලිපිනය :———.
(ඉංග්‍රීසි කැපිටල් අකුරෙන්)
(ප්‍රවේශ පත්‍ර මෙම ලිපිනයට තැපැල් කරනු ඇත)

2.1 ස්ථිර ලිපිනය :———.
(සිංහලෙන්/දෙමළෙන්)

3.0 ස්ත්‍රී/පුරුෂ භාවය :

3.1 ස්ත්‍රී - 1 පුරුෂ - 0 [ ]
අදාළ අංකය කොටුව තුළ ලියන්න

3.2 විවාහක/අවිවාහක බව :
අවිවාහක -1 විවාහක - 2 [ ]
අදාළ අංකය කොටුව තුළ ලියන්න

3.3උපන් දිනය :

වර්ෂය : [ | | | ] මාසය : [ | ] දිනය : [ | ]

3.4 ඉල්ලුම් පත්‍ර භාර ගන්නා අවසාන දිනට වයස :

අවුරුදු : [ | ] මාස : [ | ] දින : [ | ]

4.0 ජාතික හැඳුනුම්පත් අංකය :

[ | | | | | | | | | ]

5.0 තනතුර හා ශ්‍රේණිය :———.

ඉහත දැක්වෙන කරුණු නිවැරදි බවත්, ඉල්ලුම් කර ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට හිමිකම් ඇති බවත් ප්‍රකාශ කරමි. තවද විභාගය පැවැත්වීම සම්බන්ධයෙන් විභාග කොමසාරිස් ජනරාල් විසින් පනවනු ලබන නීතිරීතිවලට මම යටත් වන බවද ප්‍රකාශ කරමි.

———,
(අපේක්ෂකයාගේ අත්සන.)

දිනය :———.

විභාග කොමසාරිස් ජනරාල්,

ඉදිරිපත් කරමි.

ඉහත විස්තර දැක්වෙන අපේක්ෂකයාට/අපේක්ෂිකාවට මෙම විභාගයට පෙනී සිටීමට සුදුසුකම් ඇති බවත්, ඔහු/ඇය විසින් දක්වා ඇති භාෂා මාධ්‍යයෙන් මෙම විභාගයට පෙනී සිටීමට ඔහුට/ඇයට සුදුසුකම් ඇති බවත් සනාථ කරමි.

———,
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන,
පදවි නාමය හා නිල මුද්‍රාව.

දිනය :———.

12-614

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.